# මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

# 08-සමාජ විද්‍යාව

# 2020

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක හෝ අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවේණාචාර්යවරු ද ඇඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මූලික පිරිවෙන් අවසාන විභාගය 2020 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තා ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවේණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
මූලික පිරිවෙන් සමාජ විද්‍යාව විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමනය හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතර හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2023 ජුනි 30
පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබාදීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කෑරගල පද්මාවතී, වීදාගම සිරි සනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂ-යකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මූලික පිරිවෙන් අවසන් විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා, පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රී අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන අංශය |
| **සම්බන්ධීකරණය** | : | ඩී.ඩී.වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග |
| **විෂය සම්බන්ධීකරණය** | : | එච්. කේ. සී. කේ. කුමාරි මිය<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර<br>මානව විද්‍යා අධ්‍යයනාංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | : | ජී. වික්‍රම් සම්පත්<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ(පිරිවෙන්)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **ලේඛක මණ්ඩලය** | : | මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර<br>මානව විද්‍යා අධ්‍යයනාංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| | : | ජී. වික්‍රම් සම්පත්<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ(පිරිවෙන්)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| | : | පූජ්‍ය වටගෙදර විමලසාර හිමි<br>ගුරු සේවය I (විශ්‍රාමික)<br>පඤ්ඤාතිලකාරාමය<br>මහරගම |
| | : | පූජ්‍ය අමුණුපුරේ පේමානන්ද හිමි<br>ගුරු සේවය I (විශ්‍රාමික)<br>ශ්‍රී සිද්ධාර්ථ පිරිවෙන<br>රත්තේපිටිය<br>මැණික්දිවෙල |
| | : | පූජ්‍ය ලස්සනගම චන්දෝදය හිමි<br>ගුරු සේවය I<br>ශ්‍රී පුරාණ බෝධිමළු විහාරය<br>තේක්කවත්ත<br>කටුගස්තොට |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඩී. ජී. චමේෂි මධුෂිකා වීරසිරි<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | ආර්.එම්.නිලුපුල් ශෙහාන් යසරත්න<br>දත්ත සටහන් සහකාර |

පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **1.** | **සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු** | 01 |
| **1.1** | සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු | 01 |
| **1.2** | විෂය සාධනය පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු | 02 |
| 1.2.1 | විෂය සඳහා පෙනීසිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | 02 |
| 1.2.2 | අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය | 02 |
| 1.2.3 | පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය දිස්ත්‍රික්ක අනුව | 03 |
| 1.2.4 | ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව | 04 |
| | **I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | 05 |
| **2.** | **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** | 06 |
| **2.1.** | I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය | 06 |
| **2.2.** | I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) | 07 |
| **2.3.** | I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය | 13 |
| **2.4.** | I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය | 14 |
| **2.5.** | I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) | 15 |
| **2.6.** | තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය | 16 |
| **2.7.** | I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන හා යෝජනා | 20 |
| | **II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය** | 21 |
| **3.** | **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** | 22 |
| **3.1.** | II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය | 22 |
| **3.2.** | II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය | 23 |
| **3.3.** | II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය | 24 |
| **3.4.** | II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය | 25 |
| **3.5.** | II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, හා ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය | 26 |
| **3.6.** | II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණය හා නිගමන | 43 |
| **4.** | **පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් අවධානය යොමුකළ යුතු කරුණු** | 44 |
| **5.** | **ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** | 45 |

## 1. සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 සමාජ විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු

| | |
|---|---|
| 1 | යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට අවස්ථාව උදා කර ගැනීම |
| 2 | පවුලේ/ පන්සලේ/ පිරිවෙනේ සාමාජිකයකු වශයෙන් ඔබෙන් සමාජයටත්, සමාජයෙන් ඔබටත් ඉටුවිය යුතු යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ දැන ගැනීම |
| 3 | නිවැරදි ජීවන අරමුණු තුළින් ජීවිතය ජය ගැනීම |
| 4 | සමාජ වෙනස් වීම් හඳුනාගෙන ඒ සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීමට පෙලඹීම |
| 5 | තම අනන්‍යතාව රැක ගනිමින් සමාජයට පිවිසීමේ අවශ්‍යතාව අවබෝධ කර ගැනීම |
| 6 | ශ්‍රී ලාංකික සංස්කෘතියේ පවතින සුවිශේෂ වූ සංස්කෘතික ලක්ෂණ හඳුනාගෙන ක්‍රියා කිරීමට අවස්ථාව උදා කර ගැනීම |
| 7 | බුදු දහම ඇසුරෙන් ශ්‍රී ලාංකික සමාජය තුළ සිදු වූ පරිවර්තන අධ්‍යයනය කිරීමට හැකියාව ලැබීම |
| 8 | සමාජ පාලනයට හේතුවන සාධක හඳුනාගෙන ඒ ඒ සාධකවල වටිනාකම ඇගයීම |
| 9 | සමාජ ප්‍රශ්න/ ගැටලු හඳුනාගෙන ඊට සාධාරණ විසඳුම් සෙවීමේ අවස්ථාව උදා කර ගැනීම |
| 10 | සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් පවතින බව දැන ගැනීම |

## 1.2 සමාජ විද්‍යාව විෂයය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2083 | 23 | 2106 |
| ඉංග්‍රීසි | 18 | 00 | 18 |
| එකතුව | **2101** | **23** | **2124** |

වගුව 1.1

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 210 | 10% | 3 | 13% | 213 | 10% |
| B | 407 | 19% | 4 | 17% | 411 | 19% |
| C | 764 | 36% | 10 | 43% | 774 | 36% |
| S | 491 | 23% | 3 | 13% | 494 | 23% |
| F | 229 | 11% | 3 | 13% | 232 | 11% |
| එකතුව | **2101** | **100** | **23** | **100** | **2124** | **100%** |

වගුව 1.2

### 1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 143 | 41 | 28.67 | 40 | 27.97 | 43 | 30.07 | 17 | 11.89 | 141 | 98.60 | 2 | 1.40 |
| 2. ගම්පහ | 193 | 8 | 4.15 | 36 | 18.65 | 70 | 36.27 | 49 | 25.39 | 163 | 84.46 | 30 | 15.54 |
| 3. කළුතර | 135 | 15 | 11.11 | 32 | 23.70 | 55 | 40.74 | 25 | 18.52 | 127 | 94.07 | 8 | 5.93 |
| 4. මහනුවර | 263 | 27 | 10.27 | 43 | 16.35 | 115 | 43.73 | 59 | 22.43 | 244 | 92.78 | 19 | 7.22 |
| 5. මාතලේ | 73 | 2 | 2.74 | 14 | 19.18 | 30 | 41.10 | 20 | 27.40 | 66 | 90.41 | 7 | 9.59 |
| 6. නුවරඑළිය | 33 | 1 | 3.03 | 6 | 18.18 | 11 | 33.33 | 12 | 36.36 | 30 | 90.91 | 3 | 9.09 |
| 7. ගාල්ල | 183 | 16 | 8.74 | 47 | 25.68 | 55 | 30.05 | 44 | 24.04 | 162 | 88.52 | 21 | 11.48 |
| 8. මාතර | 140 | 11 | 7.86 | 34 | 24.29 | 47 | 33.57 | 27 | 19.29 | 119 | 85.00 | 21 | 15.00 |
| 9. හම්බන්තොට | 108 | 10 | 9.26 | 15 | 13.89 | 41 | 37.96 | 33 | 30.56 | 99 | 91.67 | 9 | 8.33 |
| 10. වව්නියාව | 03 | 1 | 33.33 | 0 | 0.00 | 1 | 33.33 | 1 | 33.33 | 3 | | 0 | 0.00 |
| 11. අම්පාර | 57 | 0 | 0.00 | 4 | 7.02 | 23 | 40.35 | 24 | 42.11 | 51 | 89.47 | 6 | 10.53 |
| 12. ත්‍රිකුණාමලය | 16 | 0 | 0.00 | 1 | 6.25 | 5 | 31.25 | 3 | 18.75 | 9 | 56.25 | 7 | 43.75 |
| 13. කුරුණෑගල | 188 | 30 | 15.96 | 36 | 19.15 | 59 | 31.38 | 48 | 25.53 | 173 | 92.02 | 15 | 7.98 |
| 14. පුත්තලම | 41 | 0 | 0.00 | 4 | 9.76 | 12 | 29.27 | 10 | 24.39 | 26 | 63.41 | 15 | 36.59 |
| 15. අනුරාධපුරය | 152 | 23 | 15.13 | 27 | 17.76 | 47 | 30.92 | 29 | 19.08 | 126 | 82.89 | 26 | 17.11 |
| 16. පොළොන්නරුව | 33 | 1 | 3.03 | 1 | 3.03 | 10 | 30.30 | 12 | 36.36 | 24 | 72.73 | 9 | 27.27 |
| 17. බදුල්ල | 102 | 10 | 9.80 | 15 | 14.71 | 45 | 44.12 | 23 | 22.55 | 93 | 91.18 | 9 | 8.82 |
| 18. මොණරාගල | 81 | 5 | 6.17 | 19 | 23.46 | 29 | 35.80 | 22 | 27.16 | 75 | 92.59 | 6 | 7.41 |
| 19. රත්නපුරය | 98 | 9 | 9.18 | 14 | 14.29 | 43 | 43.88 | 24 | 24.49 | 90 | 91.84 | 8 | 8.16 |
| 20. කෑගල්ල | 82 | 3 | 3.66 | 23 | 28.05 | 33 | 40.24 | 12 | 14.63 | 71 | 86.59 | 11 | 13.41 |
| **සමස්ත දිවයින** | **2124** | **213** | **10.03** | **411** | **19.35** | **774** | **36.44** | **494** | **23.26** | **1892** | **89.08** | **232** | **10.92** |

වගුව 1.3

## 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 11 | 0.52 | 2124 | 100.00 |
| 81 - 90 | 84 | 3.95 | 2113 | 99.48 |
| 71 - 80 | 257 | 12.10 | 2029 | 95.53 |
| 61 - 70 | 475 | 22.36 | 1772 | 83.43 |
| 51 - 60 | 522 | 24.58 | 1297 | 61.06 |
| 41 - 50 | 389 | 18.31 | 775 | 36.49 |
| **31 - 40** | **236** | **11.11** | **386** | **18.17** |
| 21 - 30 | 105 | 4.94 | 150 | 7.06 |
| 11 - 20 | 39 | 1.84 | 45 | 2.12 |
| 01 - 10 | 6 | 0.28 | 6 | 0.28 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

වගුව 1.4

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- 31 - 40 පන්ති ප්‍රාන්තරය සලකා බලන විට,
සමාජ විද්‍යාව විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2124 දෙනා අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 236කි. එය ප්‍රතිශතයක් වශයෙන් 11.11%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 386ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 18.17%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

| | | |
|---|---|---|
| **I පත්‍රය** | - | **කාලය : පැය 01යි.**<br>වරණ **4** බැගින් වූ බහුවරණ ප්‍රශ්න **40** කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් මුළු ලකුණු **40**කි. |

## 2.2 I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

01. සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ දී සමාජ ස්ථිතිකත්වය සහ සමාජ ගතිකත්වය පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?
(1) ඔගස්ට් කොම්ට් (2) එමිල් ඩුර්කයිම්
(3) කාල් මාක්ස් (4) මැක්ස් වේබර්

02. දහනවවන සියවස පමණ වන විට බටහිර සමාජය විපර්යාසයන්ට පත් වීමට බලපෑ ප්‍රධාන සාධක පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ආගමික ප්‍රතිසංස්කරණ, විද්‍යාවේ වර්ධනය, ආර්ථික ප්‍රතිසංස්කරණ
(2) කාර්මික විප්ලවය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, ප්‍රංශ විප්ලවය
(3) දේශපාලනික ප්‍රතිසංස්කරණ, බටහිරකරණය, ධනවාදයේ නැගී සිටීම
(4) ආගමික ප්‍රතිසංස්කරණ, කාර්මික විප්ලවය, දේශපාලනික ප්‍රතිසංස්කරණ

03. සමාජ විද්‍යා විෂය සංවර්ධනය සඳහා එමිල් ඩුර්කයිම් විසින් රචනා කරන ලද කෘති පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) සමාජයේ ශ්‍රම විභජනය, යථානුභූත දර්ශනය, ආත්ම ඝාතනය
(2) සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීති, ආත්ම ඝාතනය, සමාජයේ ශ්‍රම විභජනය
(3) ආත්ම ඝාතනය, ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම හා ධනවාදයේ සාරය, ආගමික ජීවිතයේ මූලික ආකාර
(4) සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීති, මිනිසා පිළිබඳ අධ්‍යයනය, සමාජයේ ශ්‍රම විභජනය

04. සමාජීය ශාස්ත්‍ර කිහිපයක් 'අ' තීරුවේ ද ඒවායින් අධ්‍යයනය කරනු ලබන ක්ෂේත්‍ර කිහිපයක් 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. මනෝ විද්‍යාව | *A* – ප්‍රාථමික සමාජයේ මිනිසාගේ සමාජ සම්බන්ධතා |
| 2. මානව විද්‍යාව | *B* – මිනිසාගේ ඓතිහාසික සමාජ පසුබිම |
| 3. ඉතිහාසය | *C* – පුද්ගලයාගේ මානසික ක්‍රියාවලිය |
| 4. දේශපාලන විද්‍යාව | *D* – රාජ්‍ය හා ආණ්ඩු සහිත සමාජය |

ඉහත 'අ' තීරුවේ සමාජීය ශාස්ත්‍ර 'ආ' තීරුවේ විෂය ක්ෂේත්‍ර සමග අනුපිළිවෙළින් නිවැරදි ව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) *A, B, C, D* (2) *B, A, D, C* (3) *C, A, B, D* (4) *C, B, D, A*

05. පුද්ගල නිදහස පදනම් කර ගත් දේශපාලන දර්ශනයට මග පෑදුණු ප්‍රංශ විප්ලවය සිදු වූ වර්ෂය කුමක් ද?
(1) 1735 (2) 1756 (3) 1789 (4) 1796

06. අන්තර් පුද්ගල සම්බන්ධතා විධිමත්ව පවත්වා ගැනීමේ වටිනාකම සඳිසා සංකල්පය මගින් පැහැදිලි කෙරෙන සූත්‍රය කුමක් ද?
(1) සිගාලෝවාද සූත්‍රය (2) වසල සූත්‍රය
(3) පරාභව සූත්‍රය (4) මංගල සූත්‍රය

- අංක **7** සහ **8** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් සමාජ පරිණාම අවධි උපයෝගී කරගන්න.

*A* – දේවවාදී අවධිය
*B* – රණකාමී අවධිය
*C* – පාරභෞතික අවධිය
*D* – කාර්මික අවධිය
*E* – යථානුභූත අවධිය

07. තාර්කික සමාජ සම්බන්ධතා සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සහිත අවධි **පමණක්** දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) *A* හා *B* (2) *B* හා *C* (3) *C* හා *D* (4) *D* හා *E*

08. අධි ස්වාභාවික බලවේගයන් කෙරෙහි බිය මුසු ගෞරවයක් දැක්වූ සහ සාමූහිකව ජීවත් වූ ජනතාවක් සිටි අවධි **පමණක්** දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) *A* හා *B* (2) *A* හා *D* (3) *B* හා *D* (4) *B* හා *E*

09. සමාජ වෙනස්වීම සම්බන්ධයෙන් කියවෙන සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?

(1) සමාජ වෙනස්වීම දිගු කාලයක් තුළ අඛණ්ඩව සිදුවන වෙනස්වීම් සමුදායකි.
(2) සමාජ වෙනස්වීම ක්ෂණයෙන් සිදුවන්නක් නොවේ.
(3) සමාජ වෙනස්වීම මගින් සංස්කෘතියේ වෙනස්කම් ඇති නොවේ.
(4) සමාජ වෙනස්වීම මගින් සාමාජිකයින්ගේ තත්ත්වය සහ කාර්යභාරයන්හි වෙනස්කම් ඇති වේ.

10. මැක්ස් වේබර් පෙන්වා දුන් ආධිපත්‍ය වර්ග තුන 'අ' තීරුවේ ද නායකත්වයට හෝ බලයට පත්වන ආකාර 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. සාම්ප්‍රදායික ආධිපත්‍ය | *A* – සුදුසුකම්, පුහුණුව හෝ තෝරාගැනීම අනුව |
| 2. අනුභසාත්මක ආධිපත්‍ය | *B* – පාරම්පරික හෝ ආරෝපිත ගුණාංග අනුව |
| 3. නෛතික ආධිපත්‍ය | *C* – අධි ස්වාභාවික හෝ අධි මානුෂික සාධක අනුව |

ඉහත 'අ' තීරුවේ ආධිපත්‍ය 'ආ' තීරුවට අනුපිළිවෙළින් නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) *A, B, C* (2) *A, C, B* (3) *B, C, A* (4) *C, A, B*

- අංක **11** සහ **12** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ලක්ෂණ උපයෝගී කර ගන්න.

*A* – පොදු දේපළ ක්‍රමයක් පැවතීම
*B* – මහා පරිමාණ කර්මාන්ත පැවතීම
*C* – පන්ති විරහිත සමාජයක් වීම
*D* – සාධාරණ ශ්‍රම විභජනයක් පැවතීම
*E* – ලාභය මත පදනම්ව නිෂ්පාදනය සිදුවීම
*F* – ශ්‍රම සූරාකෑමක් දක්නට ලැබීම

11. ඉහත ලක්ෂණ අතුරින් ධනවාදී සමාජ ක්‍රමයක ලක්ෂණ **පමණක්** දක්නට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) *A, C, D* (2) *A, D, F* (3) *B, D, E* (4) *B, E, F*

12. ඉහත දැක්වූ ලක්ෂණ අතුරින් සමාජවාදී සමාජයක **පමණක්** දක්නට ලැබෙන ලක්ෂණ' ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) *A, B, E* (2) *A, C, D* (3) *B, C, E* (4) *C, E, F*

● පහත දැක්වෙන *A, B, C, D* සිද්ධි යුගල හොඳින් අධ්‍යයනය කර අංක **13** සහ **14** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

*A* – (i) පරිපාලන යන්ත්‍රණයේ විධිමත්භාවය
(ii) කැලිකසළ ගැටලුව

*B* – (i) දියුණු, තරගකාරී වෙළෙඳපොළ
(ii) ගුණාත්මක නිෂ්පාදන

*C* – (i) පන්ති විෂමතාව
(ii) ඇති නැති පරතරය

*D* – (i) මහා පරිමාණ කර්මාන්ත
(ii) සේවා වියුක්ති අනුපාතය

13. අංක (i) හි වැඩිවීම අංක (ii) හි වැඩිවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක මොනවා ද?
(1) *A* හා *B* (2) *A* හා *C* (3) *B* හා *C* (4) *B* හා *D*

14. අංක (i) හි සංවර්ධනය වීම අංක (ii) හි අඩුවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක සඳහන් පිළිතුර තෝරන්න.
(1) *A* හා *C* (2) *A* හා *D* (3) *B* හා *C* (4) *B* හා *D*

15. සංවර්ධිත රටවල විවිධ ක්ෂේත්‍රයන්හි පවතින දියුණු තාක්ෂණය උපයෝගී කරගෙන ඌන සංවර්ධිත සමාජ දියුණු කරලීමට හැකි දිගු කාලීනව සමාජය වෙනස් කරන බලවේගය වන්නේ,
(1) නවීකරණයයි. (2) නාගරීකරණයයි.
(3) කාර්මීකරණයයි. (4) බටහිරකරණයයි.

16. "මහරජ, ඔබ මේ රටේ භාරකරුවා මිස අයිතිකරුවා නොවේ." යන ඓතිහාසික ප්‍රකාශය සිදු කරන ලදැයි ප්‍රකට වී ඇත්තේ පහත කවුරුන් විසින් ද?
(1) මහානාම තෙරුන් වහන්සේ
(2) ගෝඨගත්ත තෙරුන් වහන්සේ
(3) කුපික්කල මහාතිස්ස ස්වාමීන් වහන්සේ
(4) මිහිඳු මහ රහතන් වහන්සේ

17. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන සාර්ථක ජීවිත වෙනසක් ඇති කර ගැනීමට උපයෝගී කර ගත හැකි කරුණු හතරක් 'අ' තීරුවේ ද ඒවායින් කියවෙන මූලික අර්ථ 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. උට්ඨාන සම්පදා | *A* – උසස් ගුණ ඇති අය ඇසුරු කිරීම |
| 2. ආරක්ඛ සම්පදා | *B* – වීර්යයෙන් යුතුව කාර්යයේ යෙදීම |
| 3. කල්‍යාණ මිත්තතා | *C* – අයවැය සමතුලිතව පවත්වා ගැනීම |
| 4. සමජීවිකතා | *D* – ඉපැයූ භෝග රැක ගැනීම |

ඉහත 'අ' තීරුවේ කරුණු 'ආ' තීරුව සමග ගැළපූ විට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරන්න.
(1) *A, B, C, D* (2) *A, D, C, B* (3) *B, A, D, C* (4) *B, D, A, C*

18. ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පෘථිවියට පැමිණි ජීවීන් පෘථිවි රසයට තණ්හාව උපදවා ගැනීමත් සමග පරිණාමය වූ අයුරු දැක්වෙන සූත්‍රය කුමක් ද?
(1) අග්ගඤ්ඤ සූත්‍රය (2) චක්කවත්තී සීහනාද සූත්‍රය
(3) කූටදන්ත සූත්‍රය (4) සිගාලෝවාද සූත්‍රය

19. ජාත්‍යන්තර ආයතන සහ බහුජාතික සමාගම්වල ක්‍රියාකාරීත්වය මෙන් ම ජන මාධ්‍යයන්ගේ දියුණුවත් සමග කිසියම් සංස්කෘතියක පවතින අංග තවත් සංස්කෘතියකට නිරායාසයෙන් ව්‍යාප්ත වීම නූතන සමාජවල බහුලව දැකිය හැකි ය. මෙම ක්‍රියාවලිය හඳුන්වන්නේ,
(1) සංස්කෘතික විසරණය ලෙස ය. (2) සංස්කෘතික ලැග්ම ලෙස ය.
(3) සංස්කෘතික ගැටුම ලෙස ය. (4) සංස්කෘතික ආක්‍රමණ ලෙස ය.

20. විවිධ සංස්කෘතීන්ගෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට එකතු වූ අංග කිහිපයක් පහත දැක්වේ.

*A* – කාන්තා ඇඳුම සාරිය ලෙස පිළිගැනීම
*B* – ආගමික නාට්‍ය, ගීතිකා සහ කැරොල්
*C* – මුද්‍රණ ශිල්පය
*D* – පත්තිනි මෑණියන්ට භාරහාර වීම
*E* – සිද්ධ වෛද්‍ය ක්‍රමය
*F* – උපත්, විවාහ සහ මරණ ලියාපදිංචි කිරීම

ඉහත අංග අතුරින් දකුණු ඉන්දීය සංස්කෘතියෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට එකතු වූ අංග පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) *A, C* හා *F* (2) *A, D* හා *E* (3) *B, D* හා *E* (4) *D, E* හා *F*

21. 'ප්‍රාථමික සංස්කෘතිය' නම් කෘතිය තුළින් සංස්කෘතිය පිළිබඳ විශ්ව සාධාරණ නිර්වචනයක් සපයා ඇති මානව වංශ විද්‍යාව පිළිබඳ යුරෝපයේ ප්‍රධානතම විද්වතා ලෙස සැලකෙන්නේ

(1) රැල්ෆ් ලින්ටන් ය. (2) රේමන්ඩ් ෆර්ත් ය.
(3) ඊ.බී. ටයිලර් ය. (4) රැඩික්ලිෆ් බ්‍රවුන් ය.

● අංක **22** සහ **23** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා, සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජය වෙනස් වීම කෙරෙහි බලපෑ පහත ක්‍රියාකාරකම් උපයෝගී කරගන්න.

*A* – දේවාලගම්, විහාරගම් සහ නින්දගම් මිල දී ගෙන ඒවායේ කතෝලික පවුල් පදිංචි කිරීම
*B* – ශ්‍රී ලංකාවේ ඉඩම් හා භූමිය විධිමත්ව පවත්වා ගැනීම සඳහා තෝම්බු ක්‍රමය හඳුන්වා දීම
*C* – ඉන්දියානු සම්භවයක් සහිත වතු කම්කරුවන් උඩරට ප්‍රදේශවල පදිංචි කරවීම
*D* – දිවයින පුරා ආගම ව්‍යාප්ත කිරීමේ නිදහස මිෂනාරීන්ට නීත්‍යානුකූලව ලබා දීම
*E* – බෞද්ධ, හින්දු සහ ඉස්ලාම් ආගම් ඇදහීම තහනම් කිරීම
*F* – අනිවාර්ය රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

22. ඉහත ක්‍රියාකාරකම් අතුරින් පෘතුගීසි පාලන සමයේ සිදු කළ ක්‍රියාකාරකම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) *A, B* හා *C* (2) *A, B* හා *E* (3) *B, C* හා *D* (4) *B, D* හා *F*

23. ඉහත ඒවායින් ඉංග්‍රීසි පාලන සමයේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) *A, C* හා *D* (2) *B, D* හා *F* (3) *C, D* හා *F* (4) *D, E* හා *F*

24. බුදු දහමේ ඉගැන්වීම්වලට අනුව පුද්ගලයකුගේ උසස් හෝ පහත් බව තීරණය කළ යුතු වන්නේ පහත සාධක අතුරින් කුමක් මත ද?

(1) ජනවර්ගය අනුව (2) කුලය අනුව
(3) සමේ වර්ණය අනුව (4) හැසිරීමේ ස්වභාවය අනුව

● පහත සඳහන් ක්‍රියාකාරකම් හොඳින් අධ්‍යයනය කරන්න.

*A* – පංචශීල ප්‍රතිපත්තියට අනුගතව ජීවිතය හැඩගස්වා ගැනීම
*B* – මානව කේන්ද්‍රණවාදයට අනුගතව ක්‍රියා කිරීම
*C* – සප්ත අපරිහානි ධර්මයන්ට අනුගතව සමාජ චර්යාව පවත්වා ගැනීම
*D* – දසරාජ ධර්මයන්ට අනුගතව පරිපාලන කටයුතුවල නිරත වීම

25. ඉහත ක්‍රියාකාරකම් අතුරින් සාධාරණ සහ යුක්තිගරුක සමාජයක් ගොඩනැගීමට ඉවහල් වන ක්‍රියාකාරකම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) *A, B* හා *C* (2) *A, B* හා *D* (3) *A, C* හා *D* (4) *B, C* හා *D*

26. සමාජයේ තැනුම් ඒකකය ලෙස හැඳින්වෙන්නේ,

(1) පවුලයි. (2) පාසලයි. (3) පන්සලයි. (4) පොලීසියයි.

27. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිගෙන ඊට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සැකසීම ආරම්භ වූයේ,

(1) 1948 වර්ෂයේ සිට ය. (2) 1972 වර්ෂයේ සිට ය.

(3) 1977 වර්ෂයේ සිට ය. (4) 1985 වර්ෂයේ සිට ය.

28. දරුවන් සමාජානුයෝජනය වීමේ දී ඔවුන්ට මග පෙන්විය යුතු ආකාර කිහිපයක් 'අ' තීරුවේ ද ඒ මගින් ලැබෙන ප්‍රතිලාභ 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. නිවැරදි දැනුම ලබාගැනීමට මඟපෙන්වීම | A – ආදරය කිරීම |
| 2. දිරිගැන්වීම් සිදුකිරීම | B – උගත්කම |
| 3. ප්‍රශංසා කිරීම | C – ආත්ම විශ්වාසය |
| 4. දයාව දැක්වීම | D – අගය කිරීම |

ඉහත 'අ' තීරුවේ මග පෙන්වීම් 'ආ' තීරුවේ ප්‍රතිලාභ සමග ගැළපූ විට වඩාත්ම නිවැරදි පිළිතුර කුමක් ද?

(1) *A, B, C* හා *D* (2) *B, C, D* හා *A* (3) *C, A, D* හා *B* (4) *D, C, A* හා *B*

29. අල්පේච්ඡතා ගුණයෙන් පෝෂිත භික්ෂුවක් තුළින් දක්නට නොලැබෙන ලක්ෂණය වන්නේ මින් කුමක් ද?

(1) පුද්ගලයන් පිළිබඳ ඇලීමක් නොමැති වීම.

(2) වස්තුව හා දේපළ පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම.

(3) සංකල්ප කෙරෙහි ඇලීමක් නොමැති වීම.

(4) ශරීර සෞඛ්‍ය පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම.

30. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සහිත රටක නීති පනවනු ලබන්නේ

(1) පාර්ලිමේන්තුව මඟිනි. (2) ශ්‍රේෂ්ඨාධිකරණය මඟිනි.

(3) මහාධිකරණය මඟිනි. (4) පොලීසිය මඟිනි.

● පහත දැක්වෙන *A, B, C* සහ *D* සිද්ධි යුගල අධ්‍යයනය කර අංක **31** සහ **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

*A* – (i) ජන වර්ග අතර අන්‍යෝන්‍ය අවබෝධය
(ii) ජනවාර්ගික ගැටුම්

*B* – (i) පරස්ත්‍රීන් කෙරෙහි ලොල් වීම
(ii) ඒඩ්ස් රෝග ව්‍යාප්තිය

*C* – (i) සමාජ අනෝමීය තත්ත්වය
(ii) සිය දිවි නසා ගැනීමේ ප්‍රවණතාව

*D* – (i) නීතිය ක්‍රියාත්මක කරන පාර්ශ්වයට ජනතා සහයෝගය
(ii) අපරාධ සිදු කිරීමේ ප්‍රවණතාව

31. අංක (i) හි වැඩිවීම, අංක (ii) හි වැඩිවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) *A* හා *B* (2) *A* හා *D* (3) *B* හා *C* (4) *B* හා *D*

32. අංක (i) හි වැඩි වීම, අංක (ii) හි අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) *A* හා *C* (2) *A* හා *D* (3) *B* හා *C* (4) *B* හා *D*

● පහත සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.

*A* – සමාජ ධර්මතා සහ අගනාකම්වලට ප්‍රතිවිරුද්ධ වීම

*B* – සමාජයේ සැලකිය යුතු පිරිසකට අහිතකර ලෙස බලපෑම

*C* – අධි ස්වාභාවික සංසිද්ධීන් තුළින් ඇති වීම

*D* – සමාජමය මැදිහත්වීමකින් විසඳුමක් අපේක්ෂා කිරීම

33. ඉහත කරුණු අතුරින් සමාජ ගැටලුවක පවතින ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) *A, B* හා *C* (2) *A, B* හා *D* (3) *A, C* හා *D* (4) *B, C* හා *D*

34. "ප්‍රතිඵලය ස්ථිර වශයෙන් ම දැනගෙන මරණයට පත්වන පුද්ගලයා විසින් ම යොදා ගත් ප්‍රතිජනනාත්මක හෝ නිශේධනාත්මක හෝ ක්‍රියාවක් මඟින් සිදුවන මරණය සිය දිවි නසා ගැනීමකි." යන අර්ථකථනය කළ සමාජ විද්‍යාඥයා කවු ද?

(1) එමිල් ඩුර්කයිම් (2) කාල් මාක්ස්

(3) හර්බට් ස්පෙන්සර් (4) රැල්ෆ් ලින්ටන්

35. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සහජීවනය බිඳ වැටීමට හේතු වූ කළු ජූලිය නම් ප්‍රචණ්ඩකාරී සිද්ධිදාමය ඇතිවූ වර්ෂය කුමක් ද?

(1) 1971 (2) 1977 (3) 1980 (4) 1983

● පහත සඳහන් සිද්ධිය ඇසුරින් **36** සිට **38** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දහම් පාසලේ සිසුන් අතර නිතර නිතර ගැටුම් වාර්තා වූයෙන් ප්‍රධානාචාර්ය හිමියන් විසින් ඒ පිළිබඳ සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස රතන හිමියන්ට පවරන ලදී. ඒ අනුව රතන හිමියන් සිදු කළ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

- ❋ සිසුන්ට නොදැනෙන සහ නොපෙනෙන ලෙස සිසුන්ගේ හැසිරීම නිරීක්ෂණය කර කලහකාරී චර්යා සහිත සිසුන් හඳුනා ගැනීම
- ❋ කලහකාරී හැසිරීම් සහිත සිසුන්ගේ දෙමාපියන් වෙත ගොස් සාකච්ඡා කිරීමෙන් සහ නිරීක්ෂණයෙන් තොරතුරු අනාවරණය කර ගැනීම
- ❋ ලබාගත් තොරතුරු විශ්ලේෂණය කර නිගමන සහ යෝජනා ඇතුළත් වාර්තාවක් සැකසීම

36. මෙහි දී රතන හිමියන් විසින් සිසුන්ගේ ස්වාභාවික හැසිරීම් රටාව හඳුනා ගැනීම සඳහා භාවිත කළ නිරීක්ෂණ ක්‍රමය කුමක් ද?

(1) වක්‍ර නිරීක්ෂණය (2) ඍජු නිරීක්ෂණය

(3) සහභාගිත්ව නිරීක්ෂණය (4) විද්‍යාත්මක නිරීක්ෂණය

37. රතන හිමි විසින් දෙමාපියන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡාවේ දී පර්යේෂණය සම්බන්ධ ව ඇති වූ ප්‍රධාන වාසි සහගත තත්ත්වය මින් කුමක් විය හැකි ද?

(1) දානය, ගිලන්පස ආදී ප්‍රත්‍ය පහසුකම් නොඅඩුව ලැබීම

(2) සිසුන් සම්බන්ධ මෙතෙක් අනාවරණය නොවූ තොරතුරු හඳුනාගත හැකි වීම

(3) ප්‍රදේශයේ විවිධ සිදුවීම් පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය වීම

(4) වැඩි කාලයක් ඔවුන් සමග සාකච්ඡා කළ හැකි වීම

38. රතන හිමියන් විසින් සැකසූ නිගමන සහ යෝජනා ඇතුළත් පර්යේෂණය සම්බන්ධ සවිස්තර ලේඛනය පර්යේෂණ ක්‍රම විද්‍යාවේදී හඳුන්වනු ලබන්නේ,

(1) පර්යේෂණ යෝජනාව ලෙස ය. (2) පර්යේෂණ පිරිසැලසුම ලෙස ය.

(3) පර්යේෂණ වාර්තාව ලෙස ය. (4) පර්යේෂණ නිබන්ධනය ලෙස ය.

39. සමාජ විද්‍යා පර්යේෂණයක් සිදු කිරීමේ දී අනුගමනය කළ යුතු පළමු පියවර මින් කුමක් ද?

(1) දත්ත රැස් කිරීම (2) නියැදිය හඳුනා ගැනීම

(3) උපන්‍යාස ගොඩනැගීම (4) ගැටලුව හඳුනා ගැනීම

40. යමක් පිළිබඳ තීන්දු තීරණවලට එළඹීමේ දී විචාරාත්මක සහ නිදහස් චින්තනයේ වටිනාකම වඩාත් ම හොඳින් අවධාරණය කෙරෙන සූත්‍රය මින් කුමක් ද?

(1) මංගල සූත්‍රය (2) කාලාම සූත්‍රය (3) වසල සූත්‍රය (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

* *

**2.3** I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 1 | 21. | 3 |
| 02. | 4 | 22. | 2 |
| 03. | 2 | 23. | 3 |
| 04. | 3 | 24. | 4 |
| 05. | 3 | 25. | 3 |
| 06. | 1 | 26. | 1 |
| 07. | 4 | 27. | 4 |
| 08. | 1 | 28. | 2 |
| 09. | 3 | 29. | 4 |
| 10. | 3 | 30. | 1 |
| 11. | 4 | 31. | 3 |
| 12. | 2 | 32. | 2 |
| 13. | 3 | 33. | 2 |
| 14. | 2 | 34. | 1 |
| 15. | 1 | 35. | 4 |
| 16. | 4 | 36. | 1 |
| 17. | 4 | 37. | 2 |
| 18. | 1 | 38. | 3 |
| 19. | 1 | 39. | 4 |
| 20. | 2 | 40. | 2 |

වගුව **2.1**

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.**

## 2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය.




ප්‍රස්තාරය **2.1** (RD/16/02/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
අපේක්ෂකයන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර සපයා ඇති 6 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.83කි. එනම් 6 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 83%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව 6 ප්‍රශ්නයේ පහසුතාව 83%ක් ලෙස දැක්විය හැකිය.

## 2.5 I ප්‍රශ්න පත්‍රයේ 1 - 40 ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 01 | 1 | 75.69 | 13.41 | 5.03 | 5.27 | 0.6 |
| 02 | 4 | 5.39 | 26.71 | 17.13 | 50.06 | 0.72 |
| 03 | 2 | 22.16 | 31.38 | 27.07 | 17.13 | 2.28 |
| 04 | 3 | 4.31 | 5.03 | 82.28 | 7.78 | 0.6 |
| 05 | 3 | 11.5 | 19.88 | 44.67 | 22.4 | 1.56 |
| 06 | 1 | 83.11 | 4.31 | 7.54 | 4.19 | 0.84 |
| 07 | 4 | 11.5 | 23.11 | 33.05 | 30.9 | 1.44 |
| 08 | 1 | 57.37 | 21.56 | 10.42 | 9.94 | 0.72 |
| 09 | 3 | 24.07 | 12.57 | 44.91 | 17.72 | 0.72 |
| 10 | 3 | 8.38 | 9.82 | 68.5 | 12.46 | 0.84 |
| 11 | 4 | 7.66 | 9.46 | 19.76 | 62.63 | 0.48 |
| 12 | 2 | 6.35 | 72.46 | 10.06 | 10.66 | 0.48 |
| 13 | 3 | 15.93 | 27.66 | 27.54 | 27.78 | 1.08 |
| 14 | 2 | 21.44 | 31.62 | 19.04 | 27.07 | 0.84 |
| 15 | 1 | 39.64 | 15.21 | 26.23 | 18.44 | 0.48 |
| 16 | 4 | 8.5 | 6.35 | 7.07 | 77.6 | 0.48 |
| 17 | 4 | 9.94 | 8.02 | 8.14 | 72.93 | 0.96 |
| 18 | 1 | 76.65 | 9.94 | 6.11 | 7.07 | 0.24 |
| 19 | 1 | 52.46 | 18.56 | 12.34 | 16.05 | 0.6 |
| 20 | 2 | 25.51 | 50.3 | 15.81 | 7.9 | 0.48 |
| 21 | 3 | 27.66 | 20 | 44.91 | 6.83 | 0.6 |
| 22 | 2 | 25.15 | 42.4 | 17.13 | 14.73 | 0.6 |
| 23 | 3 | 14.97 | 14.13 | 38.2 | 31.5 | 1.2 |
| 24 | 4 | 5.27 | 9.82 | 6.59 | 77.84 | 0.48 |
| 25 | 3 | 9.1 | 13.65 | 68.98 | 7.78 | 0.48 |
| 26 | 1 | 63.47 | 13.77 | 15.33 | 7.19 | 0.24 |
| 27 | 4 | 18.92 | 28.5 | 21.08 | 29.94 | 1.56 |
| 28 | 2 | 7.9 | 76.17 | 7.19 | 8.5 | 0.24 |
| 29 | 4 | 12.81 | 23.71 | 21.08 | 41.44 | 0.96 |
| 30 | 1 | 38.68 | 37.6 | 13.77 | 8.98 | 0.96 |
| 31 | 3 | 15.69 | 18.44 | 52.34 | 13.17 | 0.36 |
| 32 | 2 | 16.65 | 54.01 | 15.69 | 13.53 | 0.12 |
| 33 | 2 | 18.92 | 54.49 | 15.57 | 10.54 | 0.48 |
| 34 | 1 | 27.07 | 19.76 | 19.64 | 32.46 | 1.08 |
| 35 | 4 | 19.64 | 19.76 | 19.52 | 39.04 | 2.04 |
| 36 | 1 | 50.06 | 18.32 | 13.65 | 17.84 | 0.12 |
| 37 | 2 | 8.74 | 72.57 | 12.81 | 5.51 | 0.36 |
| 38 | 3 | 12.1 | 14.97 | 60.72 | 11.74 | 0.48 |
| 39 | 4 | 27.54 | 13.65 | 7.43 | 50.66 | 0.72 |
| 40 | 2 | 12.81 | 61.08 | 8.26 | 17.49 | 0.36 |

**වගුව 2.2**

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

'missing' තීරයේ දක්වා ඇත්තේ කිසිඳු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරා ගත් හෝ අපේක්ෂකයන් ප්‍රතිශතයයි.

## 2.6 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

| තේමාව/ විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| සමාජ විද්‍යාවේ ආරම්භය විකාශය හා මූලික සංකල්ප | 2, 15, 19, 21, 26, 33 |
| සමාජ විද්‍යා න්‍යායන් හා පර්යාවලෝක | 1, 3, 4, 7, 8, 9, 10, 34 |
| සමාජ විද්‍යාත්මක ක්‍රමවේදය | 36, 37, 38, 39 |
| ව්‍යවහාරික සමාජ විද්‍යාව | 5, 11, 12, 13, 14, 16, 20, 22, 23, 27, 28, 30, 31, 32, 35 |
| බුදු දහම හා සමාජ විද්‍යාව | 6, 17, 18, 24, 25, 29, 40 |

වගුව 2.3

* සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය ප්‍රධාන තේමා 5කට ගොනු කර ඇත. එක් එක් තේමාවක් යටතේ ඇති ප්‍රශ්න ප්‍රමාණය විවිධාකාර වේ. ව්‍යවහාරික සමාජ විද්‍යාව තේමාවට වැඩි බරක් දී ඇති අතර ප්‍රශ්න 40න් 15ක් ම එම තේමාව යටතේ ඉදිරිපත් කර ඇත. සමාජ විද්‍යාත්මක ක්‍රමවේදය තේමාවට අඩු බරක් ලබා දී ඇති අතර ඉදිරිපත් කර ඇත්තේ ප්‍රශ්න 4ක් පමණි. අනෙක් තේමා තුන සඳහා ප්‍රශ්න සැකසීමේ දී විශේෂත්වයක් දක්වා නොමැත.




ප්‍රස්තාරය 2.2 (RD/16/02/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

සමාජ විද්‍යාවේ ආරම්භය විකාශය හා මූලික සංකල්ප තේමාව යටතේ ඇති ප්‍රශ්න 6 අතුරෙන් පහසුතාව වැඩි ම 26 ප්‍රශ්නයෙහි පහසුතාව 63.47%කි. එමෙන් ම මෙම තේමාව යටතේ පහසුතාව අඩු ම 15 ප්‍රශ්නයෙහි පහසුතාව 39.64%කි. මෙම තේමාව යටතේ ඇති ප්‍රශ්න 6 අතුරෙන් 4ක් ම 50% ඉක්මවූ පහසුතාවක් ඇති ප්‍රශ්නයි. එම ප්‍රශ්න වනුයේ 2,19,26, සහ 33ය.

සමාජ විද්‍යාවේ න්‍යාය හා පර්යාවලෝක තේමාව යටතේ ප්‍රශ්න 8ක් ඉදිරිපත් වී ඇත. මේ යටතේ ඇති 4 ප්‍රශ්නයේ පහසුතාව 82.28%කි. මෙම තේමාව සඳහා සාපේක්ෂව ඉහළ සාධනයක් දක්නට ඇති නමුත් I ප්‍රශ්න පත්‍රයේ ම පහසුතාව අඩු ම ප්‍රශ්නය ද මෙම තේමාව යටතේ ඉදිරිපත් වී ඇත. 34 ප්‍රශ්නය වන එම ප්‍රශ්නයෙහි පහසුතාව 27.07%කි. 1, 4, 8, සහ 10 යන ප්‍රශ්න 50% පහසුතා මට්ටම ඉක්මවූ ප්‍රශ්න වේ.

සමාජ විද්‍යා ක්‍රමවේදය නම් තේමාව යටතේ ප්‍රශ්න 4ක් ඇත. ඉන් පහසුතාව වැඩි ම 37 ප්‍රශ්නයෙහි පහසුතාව 72.57%කි. එමෙන් ම මෙම තේමාව යටතේ පහසුතාව අඩුම ප්‍රශ්නයෙහි පහසුතාව ද 50% ඉක්මා ඇත.

ව්‍යවහාරික සමාජ විද්‍යාව යටතේ ප්‍රශ්න 15ක් ඉදිරිපත් වී ඇත. මෙම තේමාව යටතේ 77.6%කින් යුතු ඉහළ ම පහසුතාව 16 ප්‍රශ්නය යි. පහසුතාව අඩු ම ප්‍රශ්නය වන්නේ 13 ප්‍රශ්නයයි. එහි පහසුතාව 27.54%කි. ප්‍රශ්න 15 අතුරෙන් 50%කට වැඩි පහසුතාව සහිත ප්‍රශ්න 7ක් ඇති අතර ඒවා 11, 12, 16, 20, 28, 31, සහ 32 යන ප්‍රශ්නයි.

බුදු දහම හා සමාජ විද්‍යාව තේමාව යටතේ ප්‍රශ්න 7ක් ඉදිරිපත් වී ඇත. I ප්‍රශ්නයේ පහසුතාව ඉහළ ම 6 ප්‍රශ්නයෙහි පහසුතාව 83.11%කි. මෙම තේමාව යටතේ පහසුතාව අඩු ම 29 ප්‍රශ්නයෙහි පහසුතාව 41.44%කි. මෙම තේමාව යටතේ ඇති ප්‍රශ්න 7න් 6ක් ම පහසුතාව 50% ඉක්මවා ඇත. එම ප්‍රශ්න අංක වන්නේ 6, 17, 18, 24, 28, සහ 40වේ.

| | තේමාව | පහසුතාව වැඩි ම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | පහසුතාව අඩු ම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව | තේමාවෙහි සමස්ත පහසුතාව |
|---|---|---|---|---|
| 01 | සමාජ විද්‍යාවේ ආරම්භය විකාශය හා මූලික සංකල්ප | 26(63%) | 15(40%) | 50.8% |
| 02 | සමාජ විද්‍යා න්‍යායයන් හා පර්යාවලෝක | 4(82%) | 34(27%) | 52.3% |
| 03 | සමාජ විද්‍යාත්මක ක්‍රමවේදය | 37(73%) | 36(50%) | 58.5% |
| 04 | ව්‍යවහාරික සමාජ විද්‍යාව | 16(78%) | 13(28%) | 49.2% |
| 05 | බුදු දහම හා සමාජ විද්‍යාව | 6(83%) | 29(41%) | 68.9% |

වගුව 2.4




ප්‍රස්තාරය **2.3**

සමාජ විද්‍යාවේ I පත්‍රයෙහි ප්‍රශ්න සැකසීමේ දී ඒ ඒ තේමාවන් සඳහා බර තබා ඇති ප්‍රමාණයත් එම තේමාවන්හි මධ්‍යක පහසුතාවත් මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.

ඒ අනුව ව්‍යවහාරික සමාජ විද්‍යා නම් තේමාවට 37.5%ක වැඩි බරක් තබා ඇති අතර මෙම ප්‍රශ්න පත්‍රයේ අඩු ම බරක් තබා ඇත්තේ සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයටයි. එම තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න ප්‍රතිශතය 10%කි.

වැඩි ම පහසුතාවක් දක්නට ලැබෙන්නේ බුදු දහම හා සමාජ විද්‍යා තේමාවට වන අතර එහි පහසුතාව 68.9%කි. අඩු ම පහසුතාව ව්‍යවහාරික සමාජ විද්‍යාව තේමාව වන අතර එහි පහසුතාව 49.2%ක් වේ.

## 2.7 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න 40කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. මෙමගින් සමාජ විද්‍යාව පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය, ඇගයීම, හා නිර්මාණය යන බුද්ධිමය කුසලතා මැන බැලීම සිදු කෙරේ.

මෙම බහුවරණ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන්නේ ඒ සඳහා සැකසූ විශේෂ ආකෘතියක ය. I පත්‍රයට පිළිතුරු සැපයීමට හිමි කාලය නිශ්චිතව දක්වා නොමැති වුවත් සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට හිමි පැය තුන අතුරෙන් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

I පත්‍රයේ ප්‍රශ්න 40 සැකසීමේ දී සමාජ විද්‍යාවේ ආරම්භය විකාශය හා මූලික සංකල්ප තේමාවට ප්‍රශ්න 6ක් ද, සමාජ විද්‍යා න්‍යායයන් හා පර්යාවලෝක තේමාවට ප්‍රශ්න 8ක් ද, සමාජ විද්‍යාත්මක ක්‍රමවේදය තේමාවට ප්‍රශ්න 4ක් ද, ව්‍යවහාරික සමාජ විද්‍යා තේමාවට ප්‍රශ්න 15ක් ද, බුදු දහම හා සමාජ විද්‍යා තේමාවට ප්‍රශ්න 7ක් ද ඇතුළත් කර ඇත.

සමාජ විද්‍යාවේ ආරම්භය හා මූලික සංකල්ප තේමාවෙහි පහසුතාවය 50.8%කි. සමාජ විද්‍යා විෂයය මූලික සංකල්ප පිළිබඳ මධ්‍යස්ථ මට්ටමක අවබෝධයක් අපේක්ෂකයන්ට ඇති බව මෙයින් අනාවරණය වේ. සමාජය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට සමාජ විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් තිබිය යුතු බැවින් එම සංකල්ප පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

සමාජ විද්‍යාවේ න්‍යායයන් හා පර්යාවලෝක තේමාවෙහි පහසුතාව 52.3%කි. සමාජය විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීමේ දී න්‍යායන් හා පර්යාවලෝක පිළිබඳ ඉහළ මට්ටමක අවබෝධයක් අවශ්‍ය බැවින් ඒ පිළිබඳ සිසුන්ගේ දැනුම සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.

සමාජ විද්‍යාත්මක ක්‍රමවේද තේමාවෙහි පහසුතාව 58.5%කි. සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමට සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම පිළිබඳ ප්‍රාමාණික දැනුමක් අවශ්‍ය වේ. මේ පිළිබඳ සිසුන්ගේ සාධනය ඉහළ මට්ටමකට රැගෙන ඒමට පර්යේෂණ පිළිබඳ අවබෝධයක් සිසුන් තුළ ඇති කිරීමට ක්‍රියා කළ යුතු ය.

ව්‍යවහාරික සමාජ විද්‍යාව තේමාවෙහි පහසුතාව 49.2%කි. එමෙන් ම ප්‍රශ්න පත්‍රයෙහි වැඩි බරක් එනම් 37.5%ක් (ප්‍රශ්න 40 අතරින් 15) තබා ඇත්තේ මෙම තේමාවට ය. එනම් සමාජ විද්‍යාවෙහි ප්‍රායෝගික තත්ත්වයට වැඩි අවධානයක් යොමුකර ඇති බව ඉන් හඳුනාගත හැකිය. මෙම තේමාවෙහි ශිෂ්‍ය සාධනය අනුව සමාජ විද්‍යාව ඉගෙනීමෙන් අපේක්ෂිත අරමුණක් වන සමාජය තේරුම් ගැනීමේ කුසලතාව ප්‍රමාණවත් මට්ටමක සිසුන් තුළ නොපවතින බව අනාවරණය වේ. එබැවින් පෙළපොතේ දැක්වෙන කරුණු පමණක් නොව කාලීන සමාජ සිදුවීම් පිළිබඳ සිසුන්ගේ දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් හඳුන්වා දිය යුතු ය.

බුදු දහම හා සමාජ විද්‍යාව තේමාවෙහි පහසුතාව 68.9%කි. බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම හා සමාජ විද්‍යාව අතර තුලනාත්මක අවබෝධය බහුතරයක් අපේක්ෂකයන් තුළ හොඳ තත්ත්වයක පවතින බව මෙයින් තේරුම්ගත හැකි ය. පිරිවෙන් අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක සමාජ විද්‍යා විෂය ඉගෙනීමෙන් අපේක්ෂා කරන්නේ සමාජ විද්‍යාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දීම පමණක් නොව බුදු දහම හා සමාජ විද්‍යාව අතර තුලනාත්මක දැනුම වර්ධනය කිරීමයි. එබැවින් බුදු දහමේ දැක්වෙන සමාජ විද්‍යාත්මක සංකල්පය හා සමාජ විද්‍යාව අතර තුලනාත්මක දැනුම වර්ධනය කිරීමට ක්‍රියා කළ යුතු ය.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

I පත්‍රය - කාලය : පැය 02යි.

පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

සෙසු ව්‍යූහගත ප්‍රශ්න හතෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය සඳහා ලකුණු = 20 + 40 + = 60

අවසාන ලකුණු ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණු | = | 100 |

## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයට අනුව II පත්‍රයේ ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය නිරූපණය වේ. මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. නමුත් එයට පිළිතුරු සපයා ඇත්තේ 87.31%ක ප්‍රතිශතයකි. අපේක්ෂකයන්ගෙන් 12.69%ක් අනිවාර්ය ප්‍රශ්නය වන මෙයට පිළිතුරු සපයා නොමැත.

පළමු ප්‍රශ්නය කොටස් 10කින් යුක්ත අතර සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන ලෙස සකසා ඇත.

දෙවන ප්‍රශ්නයේ සිට අටවන ප්‍රශ්නය දක්වා ප්‍රශ්න අතුරෙන් පිළිතුරු සැපයිය යුත්තේ ප්‍රශ්න හතරකට පමණි.

ඒ අනුව දෙවන ප්‍රශ්නය අපේක්ෂකයන් අතුරෙන් 61.54%ක් තෝරා ගෙන ඇත. සමාජ විද්‍යාව හැදෑරීම, විෂය බිහි වීම, සංවර්ධනය වීම, මූලික සංකල්ප ඉගෙනීමේ ප්‍රයෝජන හා බුදු දහමේ සමාජ විද්‍යාත්මක සංකල්ප මෙම නිපුණතාවේ දී අධ්‍යයනය කෙරේ. සමාජ විද්‍යා විෂය ඉගෙනීමට පදනම වැටෙන්නේ මෙම නිපුණතාව මගින් බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

මෙම පත්‍රයේ වැඩි ම තෝරා ගැනීමක් සහිත ප්‍රශ්නය තෙවන ප්‍රශ්නය යි. එය අපේක්ෂකයන් අතුරෙන් 93.08%ක් තෝරා ගෙන ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි පැය ගණනක් සපයා ඇත්තේ මෙම සමාජ පරිණාමය නිපුණතාවට ය.

ප්‍රස්තාරය **3.1** (RD/16/02/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී.)

හතරවන ප්‍රශ්නය '' සංස්කෘතිය'' නිපුණතාවෙන් සකසා ඇති අතර එම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 67.69%කි.

පුද්ගලයා හා සමාජය නිපුණතාවෙන් සකසා ඇති පස්වන ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන් අතුරෙන් 40%ක් පමණි. පුද්ගලයා කෙරෙහි සමාජය බලපාන ආකාරයත්, ශ්‍රී ලාංකේය සමාජයේ ස්වභාවය පිළිබඳවත් කරුණු දැක්වෙන මෙම ඒකකය කෙරෙහි සිසුන්ගේ උනන්දුව ඇති කළ යුතු ය.

හයවන ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන් අතුරෙන් 43.46%කි. සමාජ පාලනය නිපුණතාවෙන් එම ප්‍රශ්නය සැකසී ඇති අතර සමාජ පාලනයේ විවිධ සංරචක පිළිබඳ සිසුන්ගේ අවබෝධය තහවුරුවන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කරගත යුතු ය.

සමාජ ගැටලු නිපුණතාවෙන් සකසා ඇති හත්වන ප්‍රශ්නය අපේක්ෂකයන් අතුරෙන් 63.08%ක් තෝරා ගෙන ඇත. සමාජ විද්‍යා පර්යේෂණ පිළිබඳ දැක්වෙන අටවන ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 7.69%ක් පමණි. එය ඉතා පහළ මට්ටමකි. මෙම ඒකකය පිළිබඳ සිසුන්ගේ සාධනය හොඳ මට්ටමක නොපවතින බව ප්‍රශ්නය තෝරා ගැනීමට රුචිකත්වයක් නොදැක්වීමෙන් හඳුනාගත හැකි ය. එබැවින් අනාගත අධ්‍යාපන අවස්ථාවල දී වැදගත්වන සමාජ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ දැනුම අන්තර්ගත මෙම නිපුණතාව සිසුන්ගේ රුචිකත්වය ඇති වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීම සිදු කළ යුතු ය.

### 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 3.2

II පත්‍රයේ ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය ලකුණු ප්‍රාන්තර අනුව මෙම ප්‍රස්තාරයේ දක්වා ඇත. මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඒ සඳහා ලකුණු 20ක් හිමිවේ. 2 ප්‍රශ්නයේ සිට 8 ප්‍රශ්නය දක්වා ඇති ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර එහි එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 බැගින් හිමි වේ.

මෙම ප්‍රස්තාරය ඇසුරෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

1 ප්‍රශ්නය සඳහා මෙහි දැක්වෙන ලෙස 11.45%ක අපේක්ෂකයන් පිරිසක් ලකුණු 00 - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 - 5ත් අතර ලබාගෙන ඇති අතර 36.12%ක අපේක්ෂක පිරිසක් ලකුණු 26 - 50 % ක් එනම් ලකුණු 6 - 10ත් අතර ලබාගෙන ඇත. ඒ අනුව අපේක්ෂකයන් අතුරෙන් 47.57%ක් හෙවත් අර්ධයකට ආසන්න පිරිසක් මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 20න් 10ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් ලබාගෙන ඇති බව දැක්විය හැකිය. අනෙක් අතට ලකුණු 16 සිට 20 දක්වා ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 9.69%කි. මේ අනුව 1 ප්‍රශ්නයට හිමි ලකුණු 20 අතුරෙන් ලකුණු 10ට වැඩියෙන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අර්ධයකට වැඩි පිරිසක් ලබා ගෙන ඇති බව දැක්විය හැකිය.

මෙලෙස මෙම ප්‍රස්තාරයේ දැක්වෙන 2 සිට 8 දක්වා තොරතුරු විශ්ලේෂණය කරගත හැකිය.

## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020
**(08)** - සමාජ විද්‍යාව - **II** පත්‍රය
ප්‍රශ්නවල පහසුතා දර්ශකය




ප්‍රස්තාරය 3.3 (RD/16/04 /MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී.

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. අපේක්ෂකයන් වැඩි ම ප්‍රතිශතයක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 3(i) කොටසෙහි පහසුතා දර්ශකය 0.96කි. එනම් 3(i) කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 96%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 96%ක් ලෙස දැක්විය හැකිය. අපේක්ෂකයන් අවම ප්‍රතිශතයක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 1(i) හා (ii) කොටස්හි පහසුතා දර්ශකය 0.21කි. එනම් 1(i), (ii) කොටස් සඳහා අපේක්ෂකයන්ගෙන් 21%ක් පමණක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටස්හි පහසුතාව 21%ක් ලෙස දැක්විය හැකිය.

## 3.6 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

| |
|---|
| II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1 හා 4.2 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත. |

### II පත්‍රය

### I කොටස

**01** ප්‍රශ්නය

**(i)** **සමාජ විද්‍යාව විෂයයේ දී අධ්‍යයනය කරනු ලබන මූලික සංකල්ප දෙකක් සඳහන් කරන්න.**

සමාජ සමූහ, තත්ත්වය සහ කාර්ය භාර්ය /භූමිකාව /කාර්ය කොටස, සමාජානුයෝජණය,සමාජ සංස්ථා, සංස්කෘතිය, සමාජ ස්තරායනය, සමාජ ප්‍රශ්න, සමාජ ක්‍රියාව, ප්‍රජාව, නිලබල ක්‍රමය, අනන්‍යතාවය

**(ලකුණු 02යි)**

**(ii)** **සමාජ විද්‍යාව විෂය සංවර්ධනය සඳහා මැක්ස් වේබර්ගේ දායකත්වය හිමි වූ ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් ලියන්න.**

සමාජ ක්‍රියා, ආධිපත්‍යය/ බලය, සමාජ විද්‍යාවේ ක්‍රමවේදය, ප්‍රොතෙස්තන්තවාදය සහ ධනවාදය, සමාජ ස්තරායනය, නිලබල ක්‍රමය, පරමාදර්ශී වර්ග.

**(ලකුණු 02යි)**

**(iii)** **සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමෙන් පරහිතකාමී සමාජයක් ගොඩනගා ගැනීමට හැකි බව ඉගැන්වෙන බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න.**

සිගාලෝවාද සූත්‍රය, මහා මංගල සූත්‍රය, පරාභව සූත්‍රය, ව්‍යග්ගපජ්ජ සූත්‍රය, කරණීය සූත්‍රය මෙත්ත සූත්‍රය, කාලාම සූත්‍රය, පඨම සංවාස සූත්‍රය, සත්තභරියා සූත්‍රය, නකුලමානාපකායික සූත්‍රය.

**(ලකුණු 02යි)**

**(iv)** **සමාජයක් පරිණාමය වූ ආකාරය පෙන්වා දිය හැකි සමාජානුබද්ධ සාධක දෙකක් සඳහන් කරන්න.**

ආර්ථික සාධක, දේශපාලනික සාධක, සංස්කෘතික සාධක, සමාජ සම්බන්ධතා, තත්ත්වය සහ කාර්යභාරය, අධ්‍යාපනික සාධක, ප්‍රවාහනය, සන්නිවේදන මාධ්‍යය, කාර්මීකරණ සාධක, කෘෂි කාර්මික සාධක.

**(ලකුණු 02යි)**

**(v)** **සංස්කෘතියේ ප්‍රධාන කොටස් දෙක ලියන්න.**

1. භෞතික සංස්කෘතිය
2. අභෞතික සංස්කෘතිය

**(ලකුණු 02යි)**

**(vi)** **ශ්‍රී ලංකාවේ අතීත සමාජය පිළිබඳ ව තොරතුරු ගවේෂණය කළ හැකි මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න.**

දීපවංසය, මහාවංශය, වංසත්ථප්පකාසිනී චූල වංසය, සමන්තපාදිකාව, රාජරත්නාකරය, බෝධි වංසය, පූජාවලිය, ජාතකපොත, ලංකාවකාර සූත්‍ර, රාජතරංගනී, පාහියන් දේශාටන වාර්තා, සීගිරි ගී, ජනකවි ගී, ජන කතා, විමුන්ඩෝ, ඉන්ඩිකා, නැවුරාලිස් හිස්ටෝරියා, භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය, පර්සියානු යුද්ධය, ටොපෝග්‍රැපියා ක්‍රිස්ටියානා, ඉබන් බතූතාගේ දේශාටන වාර්තා, එදා හෙළදිව සෙල්ලිපි, නටබුන්, නානක මූලාශ

**(ලකුණු 02යි)**

**(vii)** **ශ්‍රී විජයාගමනය සිදු වූ සමයේ දී ශ්‍රී ලංකාවේ වාසය කළ ජන කණ්ඩායම් දෙකක නම් ලියන්න.**

යක්ෂ, නාග, අසුර, රාක්ෂ, දේව, නිට්ටාවෝ/ නිට්ටැවෝ

**(ලකුණු 02යි)**

**(viii)** වරදකරුවන් බන්ධනාගාරගත කිරීමේ ප්‍රධාන අරමුණු දෙක මොනවා ද?

1. පුනරුත්තාපනය
2. වරදට දඬුවම් ලබා දීම.

**(ලකුණු 02යි)**

**(ix)** **සමාජ ගැටළුක් දක්වා වර්ධනය විය හැකි අර්බුදකාරී තත්ත්වයන් දෙකක් සඳහන් කරන්න.**

මත්ද්‍රව්‍ය භාවිතය, විරැකියාව, වයස්ගතභාවය, සියදිවි නසා ගැනීම, අපචාර, අපරාධ, විවාහ ආශ්‍රිත ගැටළු, නීති විරෝධී ගබ්සා කිරීම්, කසල කළමනාකරණ ගැටලු, දේශපාලනය, ප්‍රචන්ඩත්වය, සොරකම, දේශපාලන ප්‍රචන්ඩත්වය, ගණිකා වෘත්තිය, යුධමය වාතාවරණ, ගංවතුර තත්ත්වයන්, නාය යාම්, සුළි සුළං තත්ත්වයන්, ලෙඩ රෝග ව්‍යාප්තිය.

**(ලකුණු 02යි)**

**(x)** **දත්ත ලබා ගැනීමේ ශිල්ප ක්‍රමයක් ලෙස නිරීක්ෂණ ක්‍රමයේ ඇති වාසි දෙකක් සඳහන් කරන්න.**

- නිරීක්ෂණයට භාජන වන්නන්ගේ කැමැත්ත ඇතිව හෝ නැතිව දත්ත ලබාගත හැකි වීම.
- නිරීක්ෂණයේ දී තාක්ෂණික උපක්‍රම භාවිතා කළ හැකි වීම.
- ගොළු, බිහිරි, ළමා ආදී ඕනෑම කණ්ඩායමකින් දත්ත ලබාගත හැකි වීම.
- අදහස් විකෘතිකර දැක්වීමක් සිදු නොවීම.
- පර්යේෂකයාටම ක්ෂේත්‍රයට ගොස් දත්ත ලබාගත හැකි වීම.

**(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 20යි)**

## 01 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**01 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




II පත්‍රයේ පළමු ප්‍රශ්නය වන මෙය සියලුම අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුතු අනිවාර්ය ප්‍රශ්නයක් වුව ද අංක 3.4 ප්‍රස්තාරය අනුව මේ සඳහා පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 87.31%කි. මෙම ප්‍රශ්නයට අනුකොටස් 10ක් ඇතුළත් අතර ඒ සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන්,

ලකුණු 00-05 ප්‍රාන්තරයේ 11%ක් ද
ලකුණු 06-10 ප්‍රාන්තරයේ 36%ක් ද
ලකුණු 11-15 ප්‍රාන්තරයේ 43%ක් ද
ලකුණු 16-20 ප්‍රාන්තරයේ 10%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 53%ක් වන අතර ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 47%කි.




II පත්‍රයේ පළමු ප්‍රශ්නය කොටස් 10කින් සමන්විත වේ. (i) කොටස සඳහා පහසුතාවය 21%කි. (i) කොටසින් විමසන සමාජ විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳව අවබෝධ කර ගෙන නොසිටීම නිසා නියමිත පිළිතුරු ලබා දීමට අපොහොසත් වී ඇති බව උපකල්පනය කළ හැකිය.

(ii) කොටස සඳහා පහසුතාව 21%කි. (ii) ප්‍රශ්නයේ සඳහන් සමාජ විද්‍යාඥයින් පිළිබඳ නිසි අවබෝධයක් නොතිබීම ශිෂ්‍ය සාධනය අඩු වීමට බලපා තිබිය හැකිය. (iii) කොටසට සියලු ම අපේක්ෂකයන් හොඳින් පිළිතුරු සපයා තිබුණි. එහි පහසුතාවය 89%කි. 1 ප්‍රශ්නයේ කොටස් අතුරෙන් වැඩිම පහසුතාව මෙම (iii) කොටසයි. (iv) කොටස සඳහා පහසුතාව 29%කි. (iv) කොටසෙහි සඳහන් සමාජානුබද්ධ වචනය ගළපා තේරුම් ගෙන නැති බව පෙනේ.

(v) කොටසෙහි පහසුතාව 43%කි. සංස්කෘතියේ වර්ගීකරණයක් පිළිබඳ දැඩි අවධානයක් යොමු කොට නැත. (vi), (vii), (viii), සහ (ix) කොටස් සඳහා හොඳින් පිළිතුරු සපයා ඇත. එම කොටස්හි පහසුතාව පිළිවෙළින් 79%,70%,62%, හා 54%කි. (x) කොටසෙහි ප්‍රශ්නය අනුව සමාජ අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් අපේක්ෂකයන් සිදු කර නොමැති බැවින් සාර්ථක පිළිතුරක් සැපයීමට අපොහොසත් වී ඇති බව සිතිය හැකිය. එහි පහසුතාව 28%කි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සමාජ විද්‍යා විෂය තේමා පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

**02 ප්‍රශ්නය**

**(i) සමාජ විද්‍යා දැනුම් පරාසයේ දක්නට ලබෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.**

සමාජ විද්‍යා දැනුම

- විද්‍යාත්මක පදනමක් සහිත වීම.
- අගති විරහිත වීම.
- සමාජ ජීවිතය පිළිබඳ සමස්තය ආවරණය වීම.
- සමාජය පිළිබඳ යථාර්ථය දැක්වීම.
- දැනුම ප්‍රායෝගිකව භාවිත කළ හැකි වීම.

**(ලකුණු 02යි)**

**(ii) සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.**

- සමාජය පිළිබඳ දැනුමක් ලබාගත හැකි වීම.
- මානව චර්යාවන් තේරුම්ගත හැකි වීම.
- සංස්කෘතිය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කළ හැකි වීම.
- සමාජ විවිධත්වය අගය කළ හැකි වීම.
- සමාජමය තත්ත්වයන්ට අනුව කටයුතු කළ හැකි වීම.
- සමාජ විසංවිධානකාරී තත්තවයන් වළක්වා ගැනීමට හැකි වීම.
- සමාජ වෙනස්වීම් තේරුම්ගෙන ඊට හැඩගැසිය හැකි වීම.
- සමාජ ගැටලු ඇති නොවන ලෙස ජීවත්විය හැකි වීම හා ඒවා වළක්වා ගැනීමට දායකත්වය දැක්විය හැකි වීම.

**(ලකුණු 03යි)**

**(iii) ලෞකික සහ ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීම බුදු දහමේ දැක්වෙන සමාජ විද්‍යාත්මක සංකල්ප උපයෝගී කර ගත හැකි ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් විග්‍රහ කරන්න.**

විද්‍යාත්මක චින්තනය (කාලාම හා චුල්ලහත්ථිපදෝපම සූත්‍ර)
අනිත්‍ය සංකල්පය, හේතු ඵල සංකල්පය
සමාජ අන්තර්ක්‍රියා (සිඟාලෝවාද සූත්‍රය - සදිසා නමස්කාරය)
පාලනය - පංච ශීලය, කර්ම සංකල්පය, පුනර්භවය

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**

## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**02 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




02 ප්‍රශ්නය තෝරාගත යුතු ප්‍රශ්නයකි. අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 61.54%කි. ප්‍රශ්නය කොටස් 3කින් යුක්තය. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 10 කි. ඉන්,

ලකුණු 00-02 ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයේ 38%ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයේ 19%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 43%කි. අපේක්ෂකයන්ගෙන් 57%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.




පළමු කොටසෙහි පහසුතාව 22% කි. දෙවැනි කොටසෙහි පහසුතාව 59% කි. තුන්වන කොටසෙහි පහසුතාව 53%කි. අපේක්ෂකයන් වැඩි පිරිසක් සාර්ථකව පිළිතුර සපයා ඇති බව පෙනේ. නමුත් මෙහි පළමු කොටසට අදාළ ව සමාජ විද්‍යා දැනුම් පරාසයේ ඇති වැදගත්කම පිළිබඳ සිසුන්ගේ අවබෝධය වැඩි දියුණු කළ යුතු බව අවධාරණය කෙරේ. සමාජ විද්‍යාව හැඳින්වීම ඒකකය යටතේ දැක්වෙන සමාජ විද්‍යාවේ ආරම්භය, විකාශය, මූලික සංකල්ප, විෂය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන, බුදු දහමේ දැක්වෙන සමාජ විද්‍යාත්මක සංකල්ප පිළිබඳව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවධානය යොමු කළ යුතු ය.

**3 ප්‍රශ්නය**

**(i)** **සමාජ පරිණාමීය අවධි පිළිබඳ අදහස් ඉදිරිපත් කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකුගේ නම් ලියන්න.**

ඔගස්ට් කොම්ට්, එමිල් ඩූර්කයිම්, කාල් මාර්ක්ස්, හර්බට් ස්පෙන්සර්, මැක්ස් වෙබර්

**(ලකුණු 02යි)**

**(ii)** **සමාජ ක්‍රමය වේගයෙන් සහ දිගු කාලීනව වෙනස් කරන බලවේග තුනක් සඳහන් කරන්න.**

නවීකරණය, නාගරීකරණය, බටහිරකරණය, කාර්මීකරණය, ගෝලීයකරණය, යටත්විජිතකරණය

**(ලකුණු 03යි)**

**(iii)** **ශ්‍රී ලාංකේය සමාජ පරිණාමය සඳහා මිහිඳු හිමියන්ගේ ලංකාගමනය බලපෑ ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් විග්‍රහ කරන්න.**

- බුදු දහම ප්‍රධාන ආගම බවට පත්වීම.
- කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය වීම.
- රාජ්‍ය පාලනය ධාර්මික වීම.
- අල්පේච්ඡ ජන සමාජයක් ගොඩනැගීම.
- බෞද්ධ අධ්‍යාපනය ආරම්භ වීම.
- ලේඛන සම්ප්‍රදායක් ගොඩනැගීම.
- කලා ශිල්පවල වර්ධනය

**(ලකුණු 05යි)**

**(මුළු ලකුණු 10යි)**

## 03 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**03 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




අංක 3.4 ප්‍රස්තාරය අනුව තුන්වන ප්‍රශ්නයට පිළිතුරු දී ඇති සමස්ත අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 93.08%කි. (i) කොටසට ලකුණු 2කි. (ii) කොටසට ලකුණු 3කි. (iii) කොටසට ලකුණු 5කි. මේ ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ. ඉන්,

ලකුණු 00-02 ප්‍රාන්තරයේ 07%ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයේ 46%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 46%කි. අපේක්ෂකයන්ගෙන් 54%ක් ලකුණු 7ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත.




පළමු කොටසෙහි පහසුතාව 96%කි. දෙවන කොටසෙහි පහසුතාව 64%කි. තුන්වන කොටසෙහි පහසුතාව 61%කි. II වැනි ප්‍රශ්න පත්‍රයේ ඉහළ ම තෝරා ගැනීම මෙන් ම ඉහළ ම ලකුණු ලබා ඇති පිළිතුර වන්නේ ද මෙයයි. සමාජ පරිණාමය පිළිබඳ සමාජ විද්‍යාඥයින්ගේ න්‍යායයන්, සමාජ පරිණාමය පිළිබඳ මතවාදී විග්‍රහයන් ඉදිරිපත් කෙරෙන න්‍යායාත්මක ප්‍රවේශ, සමාජ පරිණාමයේ ගාමක බලවේගය, කෙටි කාලීන හා දිගු කාලීන සමාජ වෙනස් වීම් කෙරෙහි බලපාන සාධක, ශ්‍රී ලාංකේය සමාජයේ සමාජ වෙනස්වීම් මෙන් ම සමාජ වෙනස්වීම් විග්‍රහ කළ හැකි බුදු දහමේ දැක්වෙන සංකල්ප පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවධානය යොමු කිරීම ඵලදායී වේ.

**4 ප්‍රශ්නය**

**(i) ශ්‍රී ලංකාව තුළ ඇති ආගමික සංස්කෘති දෙකක නම් ලියන්න.**

බෞද්ධ සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය, ඉස්ලාම් සංස්කෘතිය.

**(ලකුණු 02යි)**

**(ii) සංස්කෘතික ගැටුම් ඇති වීමට බලපාන ප්‍රධාන හේතු තුනක් සඳහන් කරන්න.**

- එක් සංස්කෘතියක පිළිගත් අංග වෙනත් සංස්කෘතියකට එක් කිරීමට යාම.
- මහා සංස්කෘතීන් හා උප සංස්කෘතීන් අතර නොගැලපීම්.
- පරම්පරා ගැටුම් ( එක් පරම්පරාවක් පිළිගත් දේ අනෙක් පරම්පරාවට එකතු කිරීමට යාම)
- නව සම්ප්‍රදායන් සංස්කෘතියට එක් කර ගැනීමට යාමේ දී නව නීති රීති, තාක්ෂණය සංස්කෘතියට එක් කිරීමට යාම.

**(ලකුණු 03යි)**

**(iii) සංස්කෘතිය, පුද්ගල පෞරුෂ වර්ධනය කෙරෙහි බලපාන ආකාරය නිදසුන් දෙකක් ඇසුරන් සාකච්ඡා කරන්න.**

- යම් සමාජයක පවුලක පවතින සංස්කෘතිය පවරා දීම සමාජානුයෝජනය හරහා සිදු වේ. එම නිසා එම සංස්කෘතියට එක් කිරීමට යාම.
- අගනාකම්, වටිනාකම්, ආකල්ප, විශ්වාස, ධර්මතා යනාදිය පිළිබඳ අවබෝධය සහ අධ්‍යාපනය මඟින්
- සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ හැදෙන වැඩෙන ළමයින් එම සංස්කෘතියට අදාළ ව හැඩගැසීම.
- පාරම්පරික හැසිරීම් සහ සම්ප්‍රදාය ඇසුරින් සමාජානුයෝජනයට ලක්වීම.
  **ආදී නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කිරීම ආපේක්ෂිතයි.**

**(ලකුණු 05යි)**

**(මුළු ලකුණු 10යි)**

## 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




අංක 3.4 ප්‍රස්තාරය අනුව 4 ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 67.69%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ. ඉන්,

ලකුණු 00-02 ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයේ 42%ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයේ 15%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 39%කි. අපේක්ෂකයන්ගෙන් 61%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.

4 ප්‍රශ්නයේ කොටස්වල පහසුතාව




පළමු කොටසෙහි පහසුතාව 74%කි. දෙවන කොටසෙහි පහසුතාව 41%කි. තෙවන කොටසෙහි පහසුතාව 42%කි. පිළිතුරු සැපයීම අතින් ගත් කළ අපේක්ෂකයන් මධ්‍යස්ථ සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත.

මෙහි පළමු කොටසින් දැනුම මැනෙන අතර දෙවන හා තෙවන කොටස්වලින් අවබෝධාත්මක හා ඇගයීම පිළිබඳ ඉහළ බුද්ධිමය කුසලතා අවධාරණය කෙරේ. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති ආකාරය අනුව ඉහළ බුද්ධිමය කුසලතා සංවර්ධනය කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

තව ද සංස්කෘතිය පිළිබඳ නිර්වචන, සංස්කෘතියට අදාළ ගති ලක්ෂණ, සමාජය කෙරෙහි සංස්කෘතියේ බලපෑම, ගෝලීය ප්‍රවණතා සංස්කෘතියට බලපාන ආකාරය, බුදු දහම ඇසුරෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඇතිවූ ප්‍රවණතා මෙන් ම පෞරුෂය සංවර්ධනයේ දී සංස්කෘතියේ බලපෑම පිළිබඳ විචාරශීලී අවබෝධයක් ශිෂ්‍යයන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**05 ප්‍රශ්නය**

**(i) සමාජානුයෝජනය යනු කුමක්ද ?**

- සංස්කෘතිය පවරාදීමේ ක්‍රියාවලියකි.
- සමාජයේ අනෙකුත් සාමාජිකයින් සමග එක් ව ජීවත් වීමට හුරු වීමේ ක්‍රියාවලියකි.
- සමාජයට උචිත ලෙස පෞරුෂය ගොඩනගන ක්‍රියාවලියකි.
- සමාජ ජීවිතයට හුරුපුරුදු කිරීමේ/ වීමේ ක්‍රියාවලියකි.
- උපතේ සිය මරණය දක්වා සිදුවන නොනවතින ක්‍රියාවලියකි.
- ක්‍රමවත්ව/ විධිමත්ව ඉගෙනගන්නා සහ අවිධිමත්ව ළඟාකරගන්නා වූ චර්යා රටාවකි.

**(ලකුණු 02යි)**

**(ii) බහුවිධ සමාජයක දක්නය ලැබෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.**

- එක් සමාජයක් තුළ ජාතික, ආගමික, භාෂා, කුල ආදී විවිධත්වයක් දක්නට ලැබීම.
- තම ජන කොටස්වලට ආවේණික ලක්ෂණ පවත්වා ගනිමින් සමස්ත සමාජය සමග එකට ජීවත් වීම.
- මානව කේන්ද්‍රණවාදය/ ගැටුම්
- බහු සමාජයක සංකීර්ණ සමාජ ලක්ෂණ දැකිය හැකි වීම.
- විෂමජාතිකත්වය/ සංස්කෘතික විවිධත්වය

**ලකුණු 03 යි)**

**(iii) ශ්‍රී ලාංකේය සමාජයේ සහජීවනය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.**

- ආකල්ප සංවර්ධන වැඩසටහන්
- සංස්කෘතිමය සහයෝගීතා ව්‍යාපාර
- අන්තර් ආගමික වැඩසටහන්
- මානව කේන්ද්‍රීය භාවයෙන් මිදී සමාජ කේන්ද්‍රීය වීම.
- අන් සංස්කෘතීන් වලට ගරු කිරීමට සහ විශ්වාසය තහවුරු කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.
- එක් රටක් එක් නීතියක් ක්‍රියාත්මක කිරීම.

**(ලකුණු 05 යි)**

**(මුළු ලකුණු 10යි)**

## 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 40%කි. මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 10ක් හිමි අතර
ඉන්,

ලකුණු 00-02 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයේ 23%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

5 ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 43%කි. අපේක්ෂකයන්ගෙන් 57%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත.




පළමු කොටසෙහි පහසුතාව 67%කි. දෙවන කොටසෙහි පහසුතාව 34%කි. තුන්වන කොටසෙහි පහසුතාව 46%කි. මෙම ප්‍රශ්නයේ දෙවැනි කොටසින් විමසා ඇති බහුවිධ සමාජයේ ලක්ෂණ පිළිබඳ අපේක්ෂකයන් සතුව නිසි අවබෝධයක් නැති බව පෙනේ. සමාජ විද්‍යාව සම්බන්ධ පාරිභාෂික වචන පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ. පුද්ගලයා හැඩගැස්වීමෙහි ලා සමාජය ඉවහල්වන ආකාරය පිළිබඳ විචාරශීලීභාවයක් ඇතිවන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කරගත යුතු ය.

**06 ප්‍රශ්නය**

**(i) සමාජ පාලනය සඳහා උපයෝගී කර ගත හැකි බුදු දහමේ ඉගැන්වීම් දෙකක් සඳහන් කරන්න.**

පංච නීවරණ, භාවනා, පංච ශීලය, කර්මය, පුනර්භවය, දස රාජ ධර්මය
ආධිපත්‍ය සූත්‍රයේ කරුණු - අත්තාධිපතෙය්‍ය, ලෝකාධිපතෙය්‍ය, ධර්මාධිපතෙය්‍ය
වසල සූත්‍රයේ කරුණු
පරාභව සූත්‍රයේ කරුණු
සිඟාලෝවාද සූත්‍රයේ කරුණු

**(ලකුණු 02යි)**

**(ii) හින්දු ආගමික සම්ප්‍රදාය තුළ දක්නට ඇති දෙවිවරුන් තිදෙනකු සඳහන් කර ඔවුන්ට පැවරී ඇති සුවිශේෂ කාර්යය බැගින් ලියන්න.**

| | | |
|---|---|---|
| බ්‍රහ්ම | මැවීම | |
| විශ්ණු | රැකීම | ශිව/ ඊශ්වර නැසීම |
| ශිව / ඊශ්වර | නැසීම | |

| | |
|---|---|
| කතරගම | ව්‍යාපාර/ වාහන |
| ගණ | බුද්ධිය/ ඉගෙනීම |
| සරස්වතී | අධ්‍යාපනය/ සංගීතය/ භාෂාව |
| ලක්ෂ්මි | ධනයට අධිපති/ ව්‍යාපාර |

ප්‍රාදේශීය දෙවිවරුන් හා කාර්යයන් ලියා තිබේනම් ඒ පිළිබඳව ද සැලකිලිමත් වී ලකුණු ලබාදෙන්න.

**(ලකුණු 03යි)**

**(iii) සමාජ පාලන කාර්යයේ දී අධ්‍යාපනය මගින් සිදු කෙරෙන දායකත්වය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.**

- දැනුම, ආකල්ප සහ කුසලතා සංවර්ධනය.
- ආකල්ප හා චර්යා වෙනස් කිරීමට දිරි දීම.
- ස්වීයත්වය සහ පෞරුෂ වර්ධනය
- නිපුණත්වයක් ඇති කිරීම
- විචාරශීලී චින්තනය අවධි කිරීම
- සාරධර්ම පිළිබඳ අවබෝධයක් ලබා දීම.
- සංයමය සහ විනයගරුකභාවය වර්ධනය කිරීම.
- වටිනාකම් පිළිබඳ අවබෝධයක් ඇති කිරීම.
- හොඳ නරක, සිරිත් විරිත් හඳුන්වා දීම
- සමාජ ජීවිතයකට අවශ්‍ය නිපුණතා ලබා දීම.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**

## 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 44.36%කි. ප්‍රශ්නය කොටස් තුනකින් යුක්ත අතර මුළු ලකුණු 10ක් හිමි වේ. ඉන්,

ලකුණු 00-02 ප්‍රාන්තරයේ 05%ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයේ 34%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

6 ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 34%කි. අපේක්ෂකයන් අතුරෙන් 34%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.




(i) කොටසෙහි පහසුතාවය 78%කි. (ii) කොටසෙහි පහසුතාව 65%කි. (iii) කොටසෙහි පහසුතාව 48%කි. (iii) කොටස සඳහා අධ්‍යාපනය හා සමාජ පාලනය සම්බන්ධ කර කරුණු ඉදිරිපත් කර නොමැති බව පෙනේ.

මෙහි (iii) කොටස ව්‍යවහාරික සමාජ විද්‍යාව පිළිබඳ සිසුන්ගේ සාධනය මැනෙන ප්‍රශ්නයකි. මෙම කොටස සඳහා ශිෂ්‍ය සාධනය අඩු මට්ටමක පවතින බැවින් සම්බන්ධතා විශ්ලේෂණය වර්ධනය සඳහා අවධානය යොමු කිරීම කළ යුතු ය.

විධිමත් හා අවිධිමත් සමාජ පාලන පිළිබඳවත් සමාජ පාලනයේ වැදගත්කමත් සිසුන් තුළ තහවුරුවන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීම ඵලදායී වේ.

07 ප්‍රශ්නය

**(i) ජනවාර්ගික අර්බුදයක් යනු කුමක්දැයි අර්ථකථනය කරන්න.**

ජනවාර්ගික කණ්ඩායම් දෙකක් හෝ කිහිපයක් අතර විවිධ සාධක හේතු කරගෙන හටගන්නා ගැටුම්කාරී තත්වයන් ජනවාර්ගිත අර්බුදයක් වේ.

**(ලකුණු 02යි)**

**(ii) කොරෝනා වසංගතය සමාජ ගැටලුවක් බවට පත්වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න.**

.

- සමාජයේ සැලකිය යුතු මිනිසුන් ගණනාවකට ලබපෑම.
- බොහෝ අංශවලින් මිනිසුන්ගේ සාමාන්‍ය ජීවන පැවැත්මට අහිතකර, අප්‍රසන්න සහ හානිකර වීම.
- එය විසඳීමට සාමූහික ක්‍රියාමාර්ග ගතයුතු බව සහ ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කිරීම.

**(ලකුණු 03යි)**

(මෙහිදී ජනතාවට බලපාන සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික යනා දී වශයෙන් ඇතිවන ගැටලු ලියා ඇත්නම් ඒ පිළිබඳව සලකා බලා ලකුණු ලබා දෙන්න.)

**(iii) සමාජ ගැටලු වලක්වා ගැනීම සඳහා පන්සිල් ආරක්‍ෂා කිරීමේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න**

- මත් ද්‍රව්‍ය ප්‍රශ්නය — සුරාවෙන් තොරවීමෙන්
- ලිංගික අපරාධ<br>ගණිකා වෘත්තිය<br>නීති විරෝධී ගබ්සා කිරීම් } — සුරාවෙන් තොරවීමෙන්
- හොරකම වැනි අපරාධ<br>ආර්ථික අපරාධ/ දුගී බව } — අන්සතු දේ නොගැනීමෙන්

**(ලකුණු 05යි)**

**(මුළු ලකුණු 10යි)**

## 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




අංක 3.4 ප්‍රස්තාරය අනුව 7 වන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 63.08%කි. මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 10ක් හිමිවේ. ඉන්,

ලකුණු 00-02 ප්‍රාන්තරයේ 11%ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයේ 26%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 26%කි. අපේක්ෂකයන් අතරින් 50%ක්ම ලකුණු 05ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.




(i) කොටසේ පහසුතාව 46%කි. (ii) කොටසේ පහසුතාව 53%කි. (iii) කොටසේ පහසුතාව 60%කි. මෙම ප්‍රශ්නය සඳහා ශිෂ්‍ය සාධනය මධ්‍යස්ථ මට්ටමක පවතී. මෙහි (i) කොටසෙන් සමාජ විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ දැනුම විමසා බැලේ. එයට පිළිතුරු සැපයීමේ දී සිසුන් අඩු සාධනයක් ප්‍රදර්ශනය කර ඇත. එහෙයින් සමාජ විද්‍යාවේ මූලික සංකල්ප නිර්වචනය හා අර්ථ දැක්වීම කෙරෙහි අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

සමාජ ගැටලුවක් හඳුනාගත හැකි ලක්ෂණ පිළිබඳවත්, නිර්දේශ ග්‍රන්ථවල දැක්වෙන සමාජ ගැටලු මෙන් ම කාලීන සමාජ ගැටලු නිවාරණය සඳහා බුදු දහමෙන් ගත හැකි ප්‍රයෝජන පිළිබඳවත් අවධාරණයවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගත යුතු ය.

**8 ප්‍රශ්නය**

**(i) පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගත හැකි ප්‍රධාන ආකාර දෙක ලියන්න.**

- බුද්ධිමය වශයෙන් වන දැනුම නිර්මාණය කිරීම.
- ව්‍යවහාරික වශයෙන් ගැටලුවලට විසඳුම් ඉදිරිපත් කිරීම/ ජනතාව දැනුවත් කිරීම.

**(ලකුණු 02යි)**

**(ii) පර්යේෂණයක් සඳහා දත්ත රැස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණු තුනක් සඳහන් කරන්න.**

- අධ්‍යයනය කරන ගැටලුවලට අදාළ කරුණු පමණක් රැස් කිරීම.
- දත්ත රැස්කරණ උපකරණවල ලබා දෙන උපදෙස් ප්‍රතිචාරකයාට පැහැදිලි වන සේ දැක්වීම.
- දත්ත රැස්කරණ උපකරණ නිරවුල්ව සහ පැහැදිලිව ඉදිරිපත් කිරීම.
- දත්ත රැස්කිරීමේ දී භාවිත කරන වචන සරල, පැහැදිලි හා අගතිකාමී නොවීම.
- ප්‍රතිචාරකයන්ට ගැලපෙන උපකරණ භාවිතා කිරීම.
- විකල්ප ක්‍රම මගින් අදාළ තොරතුරු ලබා ගැනීම.

**(ලකුණු 03යි)**

**(ii) පර්යේෂණයක් සිදු කිරීම සඳහා සුදුසු මාතෘකාවක් සඳහන් කර, පහත කරුණු කෙටියෙන් විස්තර කරන්න.**

**පර්යේෂණ කිරීමට බලපෑ හේතු**
**අධ්‍යාපනයෙන් අපේක්ෂිත අරමුණු**
**අධ්‍යාපනය සඳහා යොදා ගැනීමට අපේක්ෂිත නියැදිය**
**දත්ත ලබා ගන්නා ක්‍රම**

- මාතෘකාව
- ගැටලුව හැඳින්වීම
- අරමුණු
- නියදිය
- දත්ත ලබා ගන්නා උපකරණ

**(ලකුණු 05යි)**

**(මෙහිදී සැලකිලිමත් වූයේ අපේක්ෂකයාට සුදුසු පර්යේෂණ මාතෘකාවක් තෝරාගෙන එමගින් සරල පර්යේෂණයක් සිදු කිරීමට, එහි අවධි පිළිබඳ මූලික දැනුම ඇතිදැයි පරීක්ෂා කිරීමයි. ඒ අනුව සැලකිලිමත් වෙමින් පිළිතුර කියවා ලකුණු ලබා දීම සිදු කරන ලදි.)**

## 8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

8 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




අංක 3.4 ප්‍රස්තාරය අනුව 8 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 7.69%කි. මෙම ප්‍රශ්නය කොටස් තුනකින් යුක්ත අතර මුළු ලකුණු 10ක් හිමිවේ.
ඉන්
ලකුණු 00-02 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 03-05 ප්‍රාන්තරයේ 45%ක් ද
ලකුණු 06-07 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 08-10 ප්‍රාන්තරයේ 05%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

8 ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 30%කි. අපේක්ෂකයක් අතුරෙන් 25%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත.




(i) කොටසේ පහසුතාව 27%.කි. (ii) කොටසේ පහසුතාව 31%ක් ද (iii) කොටසේ පහසුතාව 47%ක් ද වේ. මෙම ප්‍රශ්නය සඳහා ශිෂ්‍ය සාධනය අවම මට්ටමක පවතී. පර්යේෂණ ක්‍රම පිළිබඳව නිසි අවබෝධයක් සිසුන් තුළ නොමැති බව පැහැදිලි වේ.

මෙම ප්‍රශ්නය මගින් සමාජ විද්‍යාවේ පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සිසුන්ගේ ප්‍රජානන හැකියාව මැන බැලේ. ප්‍රශ්නය තෝරා ගැනීම පහළ මට්ටමක පවතින අතර ශිෂ්‍ය සාධනය ද අඩු මට්ටමක පවතින බැවින් සමාජ විද්‍යා විෂය නිර්දේශය 7 වන නිපුණතාව හෙවත් සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් යන ඒකකය පිළිබඳ සිසුන් වැඩි අවධානයක් යොමු කළ යුතු ය. එහෙයින් සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා වැදගත් වන සමාජ විද්‍යාත්මක ක්‍රමවේද පිළිබඳ පරිවෙණාචාර්යවරුන් විසින් ශිෂ්‍යයින්ට අවශ්‍ය දැනුම හා අවබෝධය ලබා දීමට හැකි ඇයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගත යුතු ය.

## 3.6 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020**

**08 - සමාජ විද්‍යාව - II පත්‍රය**

**එක් එක් ප්‍රශ්නයේ පහසුතාව හා අපේක්ෂකයන් ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය**




ප්‍රස්තාරය 3,4

II ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 8කින් සමන්විත වේ. I ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි ප්‍රශ්න කොටස් 10කි. සමාජ විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ නිශ්චිත පිළිතුරු අපේක්ෂා කෙරේ. ඉතිරි ප්‍රශ්න 7 කොටස් 3කින් සමන්විත වේ. එහි I සහ II කොටස්වලට නිශ්චිත පිළිතුරු අපේක්ෂා කරන අතර III කොටස විශ්ලේෂණාත්මක පිළිතුරු අපේක්ෂා කෙරේ. පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඉතිරි ඒවායින් ප්‍රශ්න 4ක් තෝරා ගෙන සම්පූර්ණ ප්‍රශ්න 5කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

පළමු ප්‍රශ්නයේ කොටස් දහය විෂය නිර්දේශයේ දැක්වෙන නිපුණතා හත ආවරණයවන ලෙස සකසා ඇති අතර එහි පහසුතාව 50%කි. මෙම ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් වුවත් ඒ සඳහා පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 87%ක් පමණි.

තෝරාගෙන පිළිතුරු ලබා දිය යුතු ප්‍රශ්න 7 අතුරෙන් පහසුතාව වැඩිම අංක 3 ප්‍රශ්නයෙහි පහසුතාව 69%කි. අනිකුත් ප්‍රශ්න හා සැසඳීමේ දී අපේක්ෂකයන් අතුරෙන් වැඩි පිරිසක් පිළිතුරු ලබා දීම සඳහා තෝරාගෙන ඇත්තේ ද මෙම ප්‍රශ්නයයි. එම ප්‍රශ්නය සකසා ඇත්තේ සමාජ පරිණාමය යන නිපුණතාව ඇසුරෙනි.

පහසුතාව අඩු ම 8 ප්‍රශ්නයෙහි පහසුතාව 38%කි. එම ප්‍රශ්නය සකසා ඇත්තේ සමාජ අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගැනීම නම් නිපුණතාවෙනි. මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයන් අතුරෙන් 8%ක් පමණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් මෙම නිපුණතාව සඳහා යෙදවිය යුතු ය.

සංස්කෘතිය, හා සමාජ විද්‍යාව හැඳින්වීම නම් නිපුණතා සඳහා පහසුතාව 48%ක අඩු මට්ටමක පැවතියත් එම ප්‍රශ්නවලට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 68%කි. ප්‍රශ්න හොඳින් කියවා තේරුම්ගෙන වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි ප්‍රශ්න පිළිතුරු ලිවීම සඳහා තෝරාගැනීමට සිසුන්ට අවශ්‍ය නිපුණතාව ලබා දිය යුතු ය.

## 4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

* ප්‍රශ්න පත්‍රයේ හා පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් හොඳින් කියවා අනුගමනය කළ යුතු ය.
* විභාග අංකය නිවැරදිව සෑම පිටුවකම ලිවිය යුතු ය.
* ප්‍රශ්න අංකයට අදාළව පිළිතුරු ලිවිය යුතු ය.
* හැකි සෑම විටම ප්‍රශ්නයෙහි කොටස් අනුපිළිවෙළට පිළිතුරු ලිවිය යුතු ය.
* ප්‍රශ්නයට අදාළව නිශ්චිත පිළිතුරු සැපයිය යුතු ය.
* දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න පහටම අදාළ කොටස්වලට පිළිතුරු සැපයීම කළ යුතු ය.
* පෙළ පොත් හොඳින් පරිශීලනය කළ යුතු ය.
* කාල කළමනාකරණය සඳහා අවධානය යොමු කළ යුතු ය. (උපරිම වශයෙන් එක් ප්‍රශ්නයකට විනාඩි 25ක් කාලය ගත කිරීම සෑහේ.)
* ප්‍රශ්නයක් ආරම්භයේ දී අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු සැපයිය යුතු ය.
* කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ද දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු පත්‍ර ඇමිණීමේ දී පිටු අංක පිළිවෙළට ඇමිණිය යුතු ය.
* II පත්‍රයේ පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. දෙවන ප්‍රශ්නයේ සිට අටවන ප්‍රශ්නය දක්වා ඇති ප්‍රශ්න හතෙන් හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු ලිවීමේ දී නිල් කාබන් පෑනක් පමණක් භාවිතය කිරීම වඩාත් සුදුසු ය.

**විශේෂ උපදෙස්**

* ඉගෙනීමේ දී විෂය නිර්දේශය, ගුරුමාර්ගෝපදේශය හා පෙළ පොත්වල ඇති උපදෙස් හා විෂය කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.
* සමාජ විද්‍යා විෂය සම්බන්ධ අමතර පොත්, පුවත්පත් හා සඟරාවල ඇති ලිපි පරිශීලනය කර දැනුම සංවර්ධනය කර ගත යුතු ය.
* පසුගිය වර්ෂවල ප්‍රශ්න පත්‍රවලට හා ආදර්ශ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියා පිළිතුරු ලිවීමේ කුසලතාව සංවර්ධනය කර ගත යුතු ය.
* අමතර කියවීම් කාලය තුළ දී ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා තේරුම්ගෙන පිළිතුරු සැපයීමට පහසු ප්‍රශ්නයේ සිට පිළිතුරු ලිවීමට අවශ්‍ය ප්‍රශ්න සංඛ්‍යාව පෙළගස්වා ගෙන ඉන් පසු ලිවීම ඇරඹිය යුතු ය.

## 05. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

* ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පෙළපොත මෙන් ම විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ භාවිත කළ යුතු ය.

* 2017 වර්ෂයේ දී හඳුන්වා දී ඇති නිපුණතා පාදක විෂය නිර්දේශයේ ඇතැම් කරුණු 2019 වර්ෂයේ දී හඳුන්වා දී ඇති ගුරු මාර්ගෝපදේශ සම්පාදනයේ දී සංස්කරණයට ලක් වී ඇත. එම සංශෝධිත නව විෂය නිර්දේශය ගුරු මාර්ගෝපදේශවල දක්වා ඇත. එයට අනුව පොත්පත්වල නොමැති කරුණු ගුරු මාර්ගෝපදේශයන් හි නිපුණතා මට්ටම් අවසානයේ දී ඇමුණුම් ලෙස දක්වා ඇත. එහෙයින් ගුරු මාර්ගෝපදේශවල දක්වා ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් අනුගමනය කිරීම කළ යුතු ය.

* උසස් අධ්‍යාපන අවස්ථාවල දී සමාජ විද්‍යාව විෂයයක් ලෙස හදාරා නොමැතිව ඉගැන්වීම් කාර්යයේ යෙදෙන ගුරුවරුන් විෂය පිළිබඳ දැනුම සංවර්ධනය කර ගැනීමටත් විෂය හදාරා ඇති ගුරුවරුන් දැනුම යාවත්කාලීන කර ගැනීමටත් කටයුතු කළ යුතු ය. පිරිවෙන් සමාජ විද්‍යා විෂය මාලාවට අදාළව Piriven Sociology You Tube චැනලයේ ඇති පාඩම් හත අධ්‍යයනය කිරීම සිදු කළ යුතු ය.

* ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරකම් සැකසීමේ දී පහළ බුද්ධි මට්ටමේ සිට ඉහළ බුද්ධි මට්ටම් දක්වා විහිදෙන ලෙස සැලසුම්කර ක්‍රියාවට නැඟිය යුතු ය.

  එනම්, දැනුම ⟶ අවබෝධය ⟶ භාවිතය ⟶ විශ්ලේෂණය ⟶ ඇගයීම ⟶ නිර්මාණය දක්වා ගමන් කරන අයුරින් අයුරිනි.

* සිසුන්ගේ භාෂා කුසලතා (කියවීම, ලිවීම, සවන් දීම හා කතා කිරීම) විෂය ඇසුරින් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.

* ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී,

  1. සමාජ විද්‍යාවේ ආරම්භය විකාශය හා මූලික සංකල්ප
  2. සමාජ විද්‍යා න්‍යායයන් හා පර්යාවලෝක
  3. සමාජ විද්‍යාත්මක ක්‍රමවේද
  4. ව්‍යවහාරික සමාජ විද්‍යාව
  5. බුදු දහම හා සමාජ විද්‍යාව යන තේමාවන් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

* මූලාකෘති ප්‍රශ්න පත්‍රයේ ආකෘතියට අදාළ ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් පුරුදු පුහුණු කිරීම අවශ්‍ය වේ.

* විචාරාත්මක ප්‍රශ්න සඳහා පිළිතුරු ගවේෂණය කිරීමටත් ප්‍රශ්නයට ගැළපෙන ලෙස පිළිතුරු ලිවීමටත් පුරුදු පුහුණු කළ යුතු ය.

* සමාජ විද්‍යාවේ මූලික සංකල්ප සිසුන්ගේ අත් දැකීම් ඇසුරින් ගවේෂණය කිරීමට යොමුකළ යුතු යි.

* සමාජ විද්‍යාවේ විද්‍යාත්මක ක්‍රමය භාවිතයෙන් සරල පර්යේෂණයක් කිරීමට සිසුන්ට මගපෙන්විය යුතු ය.

* බුදු දහමේ දැක්වෙන සමාජ විද්‍යාත්මක සංකල්ප හා සමාජ විද්‍යාවේ ඉගැන්වීම් තුළනාත්මකව අධ්‍යයනය කිරීමට මගපෙන්වීම කළ යුතු ය.

.* අවශ්‍ය අවස්ථාවල දී ගුරු උපදේශකවරයාගේ හෝ සහකාර විෂය අධ්‍යක්ෂකවරයාගේ උපදෙස් ලබාගෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගැනීමට ක්‍රියා කිරීම කළ යුතු ය.